THE

# WHITE HACKLE

වයිට් හැකල්

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

## NEW WAY WITH NEW VISION



WHITE HACKLE | 96th Issue | April - June 2018

web :www.army.lk/lightinfantry email :editor.whitehackle@gmail.com

# EDITORS



**COLONEL OF THE REGIMENT**
Maj Gen JR Kulatunga RSP ndc psc



**CENTRE COMMANDANT**
Brig MM Kithsiri RWP RSP USP



**DEPUTY CENTRE COMMANDANT**
Col DAK Dissanayake WWV RWP RSP



**ADJUTANT RHQ SLLI**
Maj KPC Dharmasiri RSP psc SLLI



**OFFICER IN CHARGE**
**WHITE HACKLE PUBLICATION**
Maj WACS Weerasinghe SLLI


**CHIEF CONSULTANT**
Maj Gen JR Kulatunga RSP ndc psc

**EDITOR IN CHIEF**
Brig MM Kithsiri RWP RSP USP

**ASSISTANT EDITORS**
Col DAK Dissanayake WWV RWP RSP ( Deputy Centre Commandant )
Maj KPC Dharmasiri RSP psc SLLI ( Adjutant RHQ SLLI )
Maj WACS Weerasinghe SLLI (White Hackle Pulication )
Maj TMAN Thennakoon RWP SLLI (White Hackle Press)

**HONOURARY CONSULTANTS**
Gen RMD Ratnayake (Rtd) WWV RWP RSP VSV USP ndu psc
Lt Gen HV Athukorale (Rtd) VSV psc FBIM

**COMPUTER TYPE SETTING & DESIGNING**
L/Cpl Suranga RBP - White Hackle Publication

**PHOTOGRAPHERS**
Cpl Mahindasena AGMR / Cpl Pathmasiri UDN / L/Cpl Iranga HADS



# THE WHITE HACKLE
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
96th Issue - April- June 2018


## මේ පිංබර කාලයයි

අප්‍රේල් මැයි සහ ජූනි මාසයන් ලක්වැසියන් හට සුවිශේෂීවූ කරුණු රාශියක් ගෙන එන මාසයන් වන අතර, මෙම මාසයන් ආවරණය වන පරිදි මෙවර 96 වැනි පාබල හමුදා සඟරාව සැකසී ඇත. කෝකිළ නාදයත් සමඟ බක්මහේ අසිරිය උදාවත්ම තුරුළතා නව දළුලා අතුඉති මලින් එලින් බරවන අයුරු දැකගත හැකි මෙන්ම මෙම කාලය වසරේ සෞභාග ්‍යමත්ම කාලය වශයෙන් ද හැඳින්විය හැකිය. හෙළ කුල සිරිත් විරිත්වලට මුල්තැන දෙමින් ඇරඹි අප්‍රේල් මාසය ලක්වැසියන්ගේ සිරිත් විරිත් ගුණයහපත්කම් ඔප්නංවන්නා සේම එකමුතුකම, සංහිඳියාව හදවත් තුල ඇති කරන මාසයක් වශයෙන් ද හැඳින්විය හැකිය. අමාමෑණී බුදු පියාණන් වහන්සේගේ සම්බුදු තෙමඟුල සිහිකිරීමට ලෝකවාසී බෞද්ධයන් හට වෙසක් පුර පසළොස්වක පුන් පොහොය මැයි මාසය තුලදී උදාවේ. එසේම අනුබුදු මිහිඳුමාහිමියන් විසින් ලක්දිවට බුදු දහම රැගෙන ඒම අනුස්මරණය කිරීමවස් පොසොන් පොහොය දින ලක්වැසි බෞද්ධ ජනතාවට ඉතා වැදගත් වන අතර, එය ජූනි මස තුල උදාවේ. අප්‍රේල් සිට ජූනි දක්වා කාල පරාසය හෙළ කුළ සිරිත් විරිත් වලට නැඹුරුව ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ආධ්‍යාත්මික දියුණුවකට නතුවන පිංබර කාලයකි.

අප්‍රේල් මැයි සහ ජූනි මාසයන් අප සඟරාව සඳහා පමණක් නොව මුළුමහත් රටටම වැදගත් මාස තුනකි. මෙම තුන්මස තුලින් දොරට වඩින 96 වන වයිට් හැකල් කලාපයෙන් ඔබ සැමට සාමය සතුට සෞභාග්‍ය සපිරි සිංහල හින්දු අලුත් අවුරුද්දට ආසිරි පතන්නෙමු.

## READERS PLEASE WRITE IN

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 96th issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans. We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of "THE WHITE HACKLE" depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil, and English). What is value is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through " THE WHITE HACKLE ", the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write into " THE WHITE HACKLE " we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen. Our Motto is " Ich Dien", " I Serve". Let " THE WHITE HACKLE " be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-

# මෙවර කලාපයෙන්

2018 අප්‍රේල් - ජුනි

## රෙම ශ්‍රීලපාහ පුවත්


02 සුබ මොහොතින් නව තනතුරුවලට පත්වූ නිලධාරීන් සහ සෙසුනිලයින්

04 නව රෙජිමේන්තු අධිපති තුමන්ගේ රෙම ශ්‍රීලපාහ නිරීක්ෂණ චාරිකාව.

07 රෙම ශ්‍රීලපාහ සූර්යමංගලයය

08 වෙසක් පුන් පොහෝ දින රෙම ශ්‍රීලපාහ ආගමික වතාවත්

09 අභිනවයෙන් විවෘතවූ රෙම ශ්‍රීලපාහ වර්ණ ධජ තැන්පත් කිරීමේ කුටිය

11 රෙජිමේන්තු අධිපති තුමන්ගේ රෙජිමේන්තු මුලස්ථාන බළඇණි සංචාරය

13 රෙම ශ්‍රීලපාහ රණවිරු අනුස්මරණ මහෝත්සවය - 2018

15 ඇමරිකා එක්සත් ජනපදයේ ශිෂ්‍ය භට නිලධාරීන්ගේ රෙම ශ්‍රීලපාහ සංචාරය

17 කටානේ විශ්‍රාමික රණවිරු වැඩිහිටි නිවාසයේ දානමය පුණ්‍යකර්මය

19 ශ්‍රීලපාහ නිලධාරි පුහුණු දිනය

20 දැයෙන් සමුගත් බ්‍රිගේඩියර් ඊඊආර් අබේසිංහ (විශ්‍රාමික) කේඑස්වී


## රෙම ශ්‍රීලපාහ සේවා වනිතා පුවත්


21 5 වැනි වරටත් පැවැත්වූ මඤ්ඤොක්කා දන්සල


## විශේෂාංග


22 නායකත්ව ගුණාංග හා මූලධර්ම


## බළඇණි පුවත්


23 1 ශ්‍රීලපාහ පුවත්

24 2 (සෙවි) ශ්‍රීලපාහ පුවත්

25 4 ශ්‍රීලපාහ පුවත්

26 6 ශ්‍රීලපාහ පුවත්

27 7 ශ්‍රීලපාහ පුවත්

28 8 ශ්‍රීලපාහ පුවත්

29 9 (සෙවි) ශ්‍රීලපාහ පුවත්

30 10 ශ්‍රීලපාහ පුවත්

31 11 ශ්‍රීලපාහ පුවත්

32 12 ශ්‍රීලපාහ පුවත්

33 14(සෙවි) ශ්‍රීලපාහ පුවත්

34 15 ශ්‍රීලපාහ පුවත්

35 16 ශ්‍රීලපාහ පුවත්

36 19 ශ්‍රීලපාහ පුවත්

37 20 ශ්‍රීලපාහ සහ 21 (සෙවි) ශ්‍රීලපාහ පුවත්

38 23 ශ්‍රීලපාහ පුවත්

39 24 ශ්‍රීලපාහ පුවත්

40 25 ශ්‍රීලපාහ පුවත්


## විවිධ


41 උපන්දින සුබපැතුම්


# වයිට් හැකල් TOP FIVE



01 සිංහල ගැමි සංස්කෘතියෙන් ඔපවත්වූ රෙම ශ්‍රීලපාහ සූර්ය මංගලයය 2018. 04. 12



02 ශ්‍රීලපාහ වර්ණ ධජ තැන්පත් කිරීමේ කුටිය රෙජිමේන්තු අධිපතිගේ සුරතින් අභිනවයෙන් විවෘත වෙයි 2018.05.09



03 රෙම ශ්‍රීලපාහ රණවිරු අනුස්මරණ මහෝත්සවය - 2018 2018. 05. 18



04 කටානේ විශ්‍රාමික රණවිරු වැඩිහිටි නිවාසයේ රණවිරුවන් වෙත රෙම ශ්‍රීලපාහ දානමය පුණ්‍යකර්මය 2018.06.18



05 ශ්‍රීලපාහ නිලධාරි පුහුණු දිනය 2018.06.14




## කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නව රෙජිමේන්තු අධිපති තුමන් විසින් පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණු අතර, එම අවස්ථාවේ දී රෙජිමේන්තු පරිශ්‍රයේ තුල ඉදිරියේදී සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කරන අවස්ථාවක් පිළිබිඹුවන ඡායාරූපයකින් මෙවර වයිට් හැකල් සඟරාවේ මුල් පිටුව වර්ණවත් වේ.


**PRINTING & PUBLISHING**
Regimental Centre Sri Lanka Light Infantry
Telephone - 0112855204 / 0112855357 - 59
Ext - 57656 Fax- 0112855204
E-mail -editor.whitehackle@gmail.com
Website - www.army.lk/lightinfantry

# සුබ මොහොතින් නව තනතුරට පත්වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලු නිලයින්ගේ උණුසුම් සුභපැතුම්



අණදෙන නිලධාරී
7 ශ්‍රීලපාහ
නි/64016 මේජර්
කේඑම්එම්කේබී
කඩවතමුදලි ආර්ඩබ්ලිව්පී
ශ්‍රීලපාහ



අණදෙන නිලධාරී
4 ශ්‍රීලපාහ
නි/64316 මේජර් අයිආර්
හේවාපතිරන ආර්එස්පී
පීඑස්සී ශ්‍රීලපාහ



දෙවන අණදෙන නිලධාරී
11 ශ්‍රීලපාහ
නි/64432 මේජර් පීපීඑස්
වීරසූරිය ශ්‍රීලපාහ



දෙවන අණදෙන නිලධාරී
12 ශ්‍රීලපාහ
නි/64914 මේජර් කේජීසීකේ
කාරියවසම් ආර්එස්පී
ශ්‍රීලපාහ



දෙවන අණදෙන නිලධාරී
17 (සේවි) ශ්‍රීලපාහ නි/4871
ඩබ්ලිව්එම්එස් කුමාර
ශ්‍රීලපාහ



විධායක අධිකාරී
රෙම ශ්‍රීලපාහ
නි/64876 මේජර්
කේජීසී ධර්මසිරි ආර්එස්පී
පීඑස්සී ශ්‍රීලපාහ



මානි II භකාස
රෙම ශ්‍රීලපාහ
නි/64889 මේජර්
අයිටීකේ හපුආරච්චි
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
ශ්‍රීලපාහ



ප්‍රකාශන අංශභාර නිලධාරී
රෙම ශ්‍රීලපාහ
නි/64547 මේජර්
ඩබ්ලිව්ජීසීඑස් වීරසිංහ
ශ්‍රීලපාහ




රෙම ශ්‍රීලපාහ
පාලන කණ්ඩායම භාර
බළලත් නිලධාරී
සෙ/311716 බනි I එස්ජීඩී
රුවන් කුමාර (ආර්එස්පී)



මුළුතැන්ගෙය භාර
බළලත් නිලධාරී
රෙම ශ්‍රීලපාහ
සෙ/311244 බනි I
ඩබ්ලිව්ජීඑන්කේ ප්‍රනාන්දු
(ආර්එස්පී)



රෙඋපාසැමේ
රෙජිමූබ ශ්‍රීලපාහ
සෙ/316314 බනි 11 නිශාන්ත
කුමාර එල්ඩබ්ලිව්
(ආර්එස්පී)



රෙඋපාසැමේ 6 ශ්‍රීලපාහ
සෙ/333658
බනි II වීරරත්න බීඑම්



ප්‍රධාන ලිපිකරු
6 ශ්‍රීලපාහ
සෙ/311191
බනි II විජේසිරි වයිපීඑස්



ප්‍රධාන ලිපිකරු
රෙජිමූබ ශ්‍රීලපාහ
සෙ/316902 ව/සැරයන්
ප්‍රගීත් ජීජී (ආර්එස්පී)



ප්‍රධාන ලිපිකරු
රෙජි පාලන කණ්ඩායම
සෙ/317745 කෝප්‍රල්
ප්‍රසන්න එම්ඩබ්ලිව්



සරඹ උපදේශක
6 ශ්‍රීලපාහ
සෙ/318328
බනි II උපනිත් ඩබ්එච්



සරඹ උපදේශක
23 ශ්‍රීලපාහ
සෙ/316864 ව/සැරයන්
ජයලාල් එස්ජීස්



සරඹ උපදේශක
10 ශ්‍රීලපාහ
සෙ/316880 ව/සැරයන්
සමන් කුමාර කෙම්ඒ

# නව රෙජිමේන්තු අධිපති තුමන්ගේ රෙම ශ්‍රීලපාහ නිරීක්ෂණ චාරිකාව



**මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් ශ්‍රී ලංකා පාබල හමුදා 9 වැනි රෙජිමේන්තු අධිපති ලෙසින් වැඩ භාරගැනීමෙන් පසු 2018 අප්‍රේල් මස 04 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත විය.**

රෙජිමේන්තු මධ්‍යස්ථාන යට පැමිණි රෙජිමේන්තු අධිපති තුමන් මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් පිළිගන්නා ලදී.

රෙජිමේන්තු මධ්‍යස්ථානය දේශන ශාලාවේදි සියලු නිලයින් අමතමින් දේශනයක් සිදු කළ රෙජිමේන්තු අධිපති රෙජිමේන්තුවේ ඉදිරි ගමන පිළිබඳව පැහැදිලි කරන ලදී. රෙජිමේන්තු සම්ප්‍රදායන් හා සිරිත් විරිත් ආරක්ෂා කරීම හා ඉදිරියට පවත්වාගෙන යෑම සෑම දෙනාගේම වගකීමක් බවත්, ශ්‍රී ලංකා යුද හමුදාවේ පැරණිතම රෙජිමේන්තුව වශයෙන් සෙසු රෙජිමේන්තු වලට ආදර්ශමත් ලෙස තම රාජකාරි ඉටුකිරීමට වගබලාගත යුතු බවත් අවධාරනය කරන ලදී. වෘත්තිමය සාමාජිකයින්ගෙන් සමන්විත සාඩම්බර රෙජිමේන්තුවක් ලෙස ඉදිරියට යන ගමනේදී පුහුණුවීම් ඉතා වැදගත් අංගයක් බවත්, සමස්ථ රෙජිමේන්තු සාමාජිකයින්ගේ පුහුණුවීම් හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වාදෙන බවත්, මේ වන විටත් එහි මූලික අඩිතාලම දමා අවසන් බවත් ප්‍රකාශ කරන ලදී. දේශනය අවසානයේ රෙජිමේන්තු කඳවුරු භූමියේ කාර්යාල සංකීර්ණය, බළලත් නිලධාරි හා සැරයන් නිවස්නය, මුළුතැන්ගෙය, ආයුධාගාරය හා මුද්‍රණාලය නිරීක්ෂණය කරමින් චාරිකාවක යෙදුණු අතර, කඳවුරේ වත්මන් තත්වය ඉහල නංවා අලංකාර ලෙස පවත්වා ගැනීම සම්බන්ධයෙන් එහිදී උපදෙස් ලබා දෙන ලදී.








Coca-Cola







# සිංහල ගැමි සංස්කෘතියෙන් ඔපවත්වූ රෙම ශ්‍රීලපාහ සූර්ය මංගල්‍යය 2018



**සූර්යා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමඟ උදාවන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද මෙවරත් ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින් විසින් ඉතාමත් උත්කර්ෂවත් ලෙස සමරන ලදී.**

2018 බක් මස 12 වන දින උදෑසන රසල් හයින් ක්‍රීඩාංගනයෙදී ශ්‍රී ලංකා ජාතික ධජය හා රෙම ශ්‍රීලපාහ රෙජිමේන්තු ධජය ඔසවා උත්සවත්ශ්‍රීයෙන් ආරම්භ කරන ලද රෙම ශ්‍රීලපාහ සූර්ය මංගල්‍යයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙසින් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඩබ්ලිව්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් හා ශ්‍රීලපාහ සේවා වනිතා සංගමයේ ගරු සභාපතිනි තුෂාරි කුලතුංග මැතිණිය සහභාගී වු අතර, මේ අවස්ථාව සඳහා රෙජිමේන්තු මහකාරක සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් එම මැතිණියන් සමග සහභාගි විය. ගැමි සිංහල සම්ප්‍රධායන් පිළිබිඹු කරමින් නිර්මාණය කරන ලද ගැමිගෙදර මුලික කර ගනිමින් විවිධ ඉපැරණි සිංහල සංස්කෘතික අංග රාශියක් අවුරුදු උත්සව භූමිය තුල ඒකරාශිවී තිබු අතර, රබන් ගැසීම, ගොනාබැඳීී තිරික්කලය සමගින් ගැමිගෙදර ආරච්චිරාල ඇතුලු පිරිස අලුත් අවුරුදු චාරිත්‍ර වලට අනුව රෙජි අධිපති තුමන් ඇතුලු සම්භාවනීය පිරිස පිළිගන්නා ලදී. මෙම සංකෘතික උත්සවය නිමාවන තෙක්ම විවධ අවුරුදු ක්‍රීඩා රැසක් පැවැත්වූ අතර, ගම හරහා දිවීම, කොට්ටාපොරය, ලිස්සන ගසේ නැගීම, පොල් අතු විවීම, 2018 අලුත් අවුරුදු කුමරා සහ කුමරිය තේරීම කුඩා ළමුන් සඳහා බනිස් කෑමේ තරඟය වැනි ජන ක්‍රීඩාවන් රැසක් පවත්වා එමගින් ජයග්‍රාහී අයවලුන් වෙත ත්‍යාග පිරිනැමීම ද සිදුකරන ලදී.



රෙම ශ්‍රීලපාහ අලුත් අවුරුදු
ගැමි ගෙදර




ගම හරහා දිවීම



කොට්ටා පොර



බැලුම් පිපිරවීම





ලිස්සන ගසේ නැගීම



ආබාධිත විරුවන්ගේ රෝද පුටු ධාවන තරඟය





ගම හරහා දිවීමේ ප්‍රථම ස්ථානය



2018 අලුත් අවුරුදු කුමරා



2018 අලුත් අවුරුදු කුමරිය

රෙම ශ්‍රීලපාහ පුවත්

# වෙසක් පුන් පොහෝ දින

## රෙම ශ්‍රීලපාහ ආගමික වතාවත්

සම්බුදු තෙමඟුල සමරන වෙසක් පොහොය දිනය නිමිතිකරගෙන 2018.04.29 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව වෙතින් යුද හමුදා බෝධිරාජාරාම විහාරස්ථානයේ සිල් සමාදන් වූ 3700ක් පමණ බැතිමතුන් වෙනුවෙන් උදා, දිවා, සවස, රාත්‍රී හා පසුදින උදෑසන ගිලන්පස ලබාදීමේ ආගමික වැඩසටහනක් සිදුකල අතර, මෙම පුණ්‍යකර්මය සඳහා පාබල හමුදා සෙබලුන් විශාල පිරිසක් සහභාගී විය. තවද, වෙසක් පොහෝ දිනයට සමගාමීව රෙජිමේන්තුවට අයත් ඒකකයන් වෙතින් වෙසක් කාළාපයන් සඳහා දර්ශනීය පහන් කුඩු නිර්මාණය කරන ලදී. මෙහිදී බෞද්ධ රශ්මිය වෙසක් කළාපය සඳහා 9 (සෙවි) ශ්‍රීලපාහ ඒකකය වෙතින් නලපාන ජාතකය පිළිඹිබු වන වෙසක් කූඩුවක් ද, බෞද්ධාලෝක වෙසක් කළාපය සඳහා 8 ශ්‍රීලපාහ ඒකක විසින් චුල්ලපදුම ජාතක කථාව නිරූපණය වන වෙසක් කූඩුවක් ද, පනාගොඩ වෙසක් කළාපය සඳහා 4 ශ්‍රීලපාහ ඒකකය විසින් මුචලින්ද නාගදරණ පිළිඹිබු වන වෙසක් පහන් කූඩුවක් ඉදිරිපත් කර තිබුණි. සම්බුදු තෙමඟුල වර්ණවත් කරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙතින් වෙසක් පුන් පෙහෝ දින සිදුකරන ලද මෙම ආගමික වැඩසටහන් සමූහය සඳහා දායක වූ සියලුම පාබල සෙබලුන් වෙත මෙම පුණ්‍ය බලමහිමයේ ආනිශංස ලැබේවායි අප ප්‍රාර්ථනා කරන්නෙමු.





4 ශ්‍රීලපාහ පහන් කූඩුව



8 ශ්‍රීලපාහ පහන් කූඩුව



9(සෙවි) ශ්‍රීලපාහ පහන් කූඩුව

රෙජි ශ්‍රීලපාහ පුවත්

# රෙජිමේන්තු අධිපතිගේ සුරතින් අභිනවයෙන් විවෘතවූ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ වර්ණ ධජ තැන්පත් කිරීමේ කුටිය




ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ නවතමයෙන් ඉදිකළ වර්ණ තැන්පත් කිරීමේ කුටිය 2018.05.09 වන දින රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ සුරතින් සුභ මොහොතින් විවෘත කරන ලදී.



ශ්‍රී ලංකා පාබල හමුදාවේ මුලාරම්භය ස්වේච්ඡා බළඇණියකින් ආරම්භ වන අතර, ඒ අනුව ශ්‍රී ලංකා පාබල හමුදාව 1881 අප්‍රේල් මස 01 වන දින සිලෝන් වොලන්ටියර්ස් නිමින් ආරම්භ විය. දකුණු අප්‍රිකාවේ පැවැති බුඅර් වරුන්ගේ යුද්ධයට මෙන්ම පළවන සහ දෙවන ලෝක යුද්ධ වලට සක්‍රීයව පාබල හමුදා සොල්දාදුවන් දායකත්වය ලබාදි ඇත. මෙලෙස වසර 137 ක් තරම් පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදාව 1922.03.22 වන දින ගෞරවණීය කර්නල් වන වෙල්ස්හි කුමරු (පසුව අටවන එඩ්වඩ් රජු) වෙතින් රාජකීය වර්ණයන්ගෙ න් ද 1954.04.21 වන දින දෙවන එළිසබත් මහ රැජිණ වෙතින් රාජණී වර්ණයන්ගෙන්ද පිදුම්ලබන ලදී. පසුව 1978.10.10 වන දින ශ්‍රී ලංකා ප්‍රජානතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ජනාධිපති අතගරු ජේආර් ජයවර්ධන මැති තුමන් අතින් 1 ශ්‍රීලපාහ සහ 2 (සෙව්) ශ්‍රීලපාහ වෙත ජනාධිපති වර්ණ ප්‍රධානය කරන ලදී.

ඉන්පසු 1989.10.23 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය ස්ථාපිත කළ අතර, වර්ණ ලබාදී වසර 25කට පසුව එනම් වර්ෂ 2013 වර්ෂයේදී ප්‍රතිප්‍රදානය සිදුකල යුතු වුවත් විවිධ කරුණු හේතුවෙන් වර්ණ ප්‍රදානය කිරීමට නොහැකි වු අතර, 2015 ක් වු ඔක්තෝබර් මස 26 වන දින එවකට රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් කරන ලද ගෞරවනීය ආරාධනයෙන් සපැමිණි ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති හා සන්නද්ධ සේවා සේනාධිනායක මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ සුරතින් රෙජිමේන්තු මධ්‍යස්ථාන සරඹ භූමියේදී ප්‍රථම වරට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය කළ අතර, 1 ශ්‍රීලපාහ, 2 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයන් වෙත ජනාධිපති වර්ණ හා ඒකක වර්ණ ප්‍රතිප්‍රදානය කරන ලදී. ප්‍රදානය කරන ලද වර්ණ ධජ ගෞරවාන්විතව තැන්පත් කිරීම සඳහා මෙම වර්ණ ධජ තැන්පත් කිරීමේ කුටිය ගොඩනගන ලද අතර, මෙම විවෘත කිරීමේ උත්සව අවස්ථාව සඳහා රෙජිමේන්තු මහාකාරක සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන මේජර් ජෙනරාල් ආර්ඒ නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු, මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු, මේජර් ජෙනරාල් ඒඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු ඇතුලු රෙජිමේන්තු මහ කාරක සභාවේ නිලධාරීන් සහ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී හා නියෝජ්‍ය සේනාවිධායක කර්නල් ඩීඒකේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලය ද,1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී, 2 (සෙව්) ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් විශාල පිරිසක් හා රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සෙසුනිලයන් විශාල පිරිසක් සහභාගී වූහ.





රෙම ශ්‍රීලපාහ පුවත්

# රෙජිමේන්තු අධිපති තුමන්ගේ ශ්‍රීලපාහ රෙජිමේන්තු මුලස්ථාන බළඇණි සංචාරය



පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රථම නිල සංචාරය අරඹමින් ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් ක්‍රියාන්විතයේදී තුවාල ලබා ආබාධිත තත්වයට පත්ව සිටින සෙබලුන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා බුස්සේ පිහිටි රෙජිමේන්තු මුලස්ථාන බළඇණිය වෙත පැමිණෙන ලදී.





අණදෙන නිලධාරි මේජර් ආර්එම්එස් රාජකරුණා ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් රෙජිමේන්තු අධිපතිතුමන් ප්‍රධාන පිවිසුම් දොරටුව අසලදී යුද හමුදා චාරිත්‍රානුකූලව පිළිගත් අතර, රෙජිමේන්තු අධිපතිතුමන් වෙත අභිමානවත් කඳවුරු මුරයක් පුද කල අතර, තේ පැන් සංග්‍රහයෙන් අනතුරුව එතුමාගේ සංචාරය සිහිවීමවස් කඳවුරු භූමිය තුල අඹ පැලයක් රෝපණය කරන ලදී.

පසුව අණදෙන නිලධාරි සහ රෙජිමේන්තු පුහුණු පාසැලේ ප්‍රධාන උපදේශක විසින් වත්මන් තත්වය පිළිබඳ පැහැදිලිකිරීමක් සිදුකරන ලදී. දේශන ශාලාවේදී සියලුම නිලයින් ඇමතූ රෙජිමේන්තු අධිපති තුමන් මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවය ආරක්ෂා කරනුවස් රට දැය වෙනුයෙන් දිවිපිදූ රණවිරුවන් කල සේවය අගයමින් සියලු නිලයින් අමතන ලදී. ඉන් අනතුරුව රණක්ෂිතයට පත් සෙබලුන්ගේ සුවදුක් විමසමින් ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ සොයාබලමින් කඳවුරු සංචාරයක් සිදුකරන ලද අතර, මෙහිදී සියලුම භඨ නිවාස වෙත ගොස් සෙබලුන් සමඟ පෞද්ගලිකවම කතා කරමින් ඔවුන් සියලු දෙනාගේ අවශ්‍යතා හා අඩුපාඩු සොයාබැලීමට කටයුතු කරන ලදී. තවද මෙම රෙජිමේන්තු මුලස්ථාන බළඇණියට අයත් ඉදිකරමින් පවතින උත්සව ශාලාව නිරීක්ෂණය කල අතර, එහි ඇති වැදගත්කම හා අනාගතයේ ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳ නිලධාරින් සමඟ සාකච්ඡා කරන ලදී.

මෙම අවස්ථාව සඳහා 58 වන සේනාංකයේ සේනාංකාධිපති හා මෙම රෙජිමේන්තු මහා කාරක සභාවේ ජ්‍යෙෂ්ඨ සාමාජික මේජර් ජෙනරාල් ඊඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු, රෙම ශ්‍රීලපාහ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී සහ නියෝජ්‍ය සේනාවිධායක කර්නල් ඩීඒකේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරින්ද මෙම සංචාරය සඳහා සහභාගී විය.

නිරීක්ෂණ චාරිකාවෙන් අනතුරුව අබාධිත සෙබලුන්ගේ ජිවන තත්වය ඉහල නැන්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා ආරම්භ කළ යුතු ව්‍යාපෘතින් පිළිබඳව අණදෙන නිලධාරි වෙත උපදෙස් දිමෙන් අනතුරුව දිවා භෝජන සංග්‍රහයකට සහභාගි වී අමුත්තන්ගේ සටහන් පොතෙහි සටහනක් තැබීමෙන් පසු රෙජිමේන්තු අධිපතිතුමන් බළඇණියෙන් නික්ම යන ලදී.





# රණවිරු අනුස්මරණ උත්සවය 2018

රාජ්‍ය රණවිරු සැමරුම් උත්සවයට සමගාමීව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද රණවිරු සැමරුම් උළෙල 2018.05.18 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයෙ **"අභිමන් මුදුණත"** රණවිරු ස්මාරකය අභියස අභිමානවත් අන්දමින් පවත්වන ලදී.



දේශයේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවය වෙනුවෙන් කුරිරු ත්‍රස්තවාදීන් සමඟ සටන් වැද මාතෘභූමියට සාමය උදාකරලීම උදෙසා ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතින් තම ප්‍රාණදානය කැප කළ නිලධාරීන් 168 දෙනෙක් හා සෙසුනිලයින් 3700 දෙනෙකු ඇතුලු අභීත රණවිරුවන් මෙහිදී අනුස්මරණය කරන ලදී.

මෙම රණ විරු සැමරුම් උළලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී පැමිණි අතර, එතුමා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රණවිරු ස්මාරකය අභියසදී රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් පිළිගන්නා ලදී. ඉන් අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රණවිරු ස්මාරකය අභියස ජාතික ධජය, යුද හමුදා ධජය, රෙජිමේන්තු ධජය එසවීමෙන් හා ජාතික ගීය, යුද හමුදා ගීතය හා පාබල හමුදා ගීතය ගායනා කිරීමෙන් අනතුරුව රෙජිමේන්තු අධිපති තුමන් විසින් රණවිරු ස්මාරකයට මල් කලඹක් තබා මියගිය රණවිරුවන් සිහිකරමින් ඔවුන් හට ශ්‍රී ලංකා පාබල හමුදාවේ උපහාරය පුදකරන ලදී. ඉන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විධායක අධිකාරී විසින් යුද්ධ හමුදාධිපති තුමාගේ රණවිරු සැමරුම් දින පණිවිඩය කියවීමෙන් අනතුරුව ප්‍රාණදානය ලබාදුන් රණවිරුවන්ගේ වීර රාවය ජාතියට හඬගා කියන මෙම රණවිරු ස්මාරකය ඔවුන් මතකාවර්ජනයකොට උපහාර පිදීම ජාතියේ මෙන්ම අප සියලු දෙනාගේම පරම වගකීමක් බවත්, ඔවුන් සිදුකලාවු ප්‍රාණදානය හේතුකොටගෙන පමණක්ම ඔබ අප භුක්තිවිඳින්නා වු මෙම නිදහස ලක්ධරණී තලය වෙත උදාවී ඇති බවත්, ගෙවීගිය තිස් වසරකට ආසන්න කාලයක් පුරාවට රටට එල්ලවූ විවිධ තර්ජන හා අභියෝගවලදී මාතෘභූමියේ සවෛරීත්වය, භෞමික අඛණ්ඩතාව මෙන්ම ජන ජීවිත වල සුරක්ෂිතතාව වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් ඉටුකරනු ලැබූ සේවාව හා එහිදී ජීවිත පරිත්‍යාගයෙන් යුතුව නොපැකිළිව සිදුකරන ලද පුරෝගාමී මෙහෙවර සඳහන් කරමින් රෙජිමේන්තු අධිපති තුමා විසින් රණවිරු සැමරුම් උත්සවය අමතා ප්‍රාණදානය කැපකලාවූ සියලුම විරුවන් හට සිය ගෞරවණීය ආචාරය පිළිගන්වන ලදී. ඉන් අනතුරුව සියලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා නිලධාරීන්, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු යුද්ධයට තම කායදානය පුදකල අභීත රණවිරුවන් හා දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන් සමඟ දිවා භෝජන සංග්‍රහය භුක්ති විඳින ලදී.

මෙදින සන්ධ්‍යා භාගයේ අප රෙජිමේන්තු විහාරස්ථානයේදී පූජ්‍ය පාදුක්ක බටවල ශ්‍රී සුගත ගුණවර්ධන සේනාධිපති ගෞරව ශාස්ත්‍රපති ත්‍රිපිටකාචාර්ය දික්පිටිගොඩ සෝම ශාන්ත හිමි විසින් මියගිය රණවිරුවන් හට පිං පමුණුවමින් හා අබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන්ට ඉක්මන් සුවය පතමින් සියලුම රණවිරුවන් හට දීර්ඝායුෂ පතමින් බෝධිපූජාවක් පවත්වා මෙම පිංකමට සහභාගී වු සේවයේ යෙදී සිටින රණවිරුවන් හට ධර්මදේශණයක් පවත්වන ලදී.









රෙජිමේන්තු ශ්‍රීලපාහ පුවත්

# ඇමරිකා එක්සත් ජනපදයේ ශිෂ්‍ය භට නිලධාරින්ගේ රෙජිමේන්තු ශ්‍රීලපාහ සංචාරය

**ඇමරිකා එක්සත් ජනපද ශිෂ්‍ය භට නිලධාරීන් 30 ක කණ්ඩායමක් 2018 මැයි මස 24 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අධ්‍යයන චාරිකාවක නිරත විය.**



රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි හා මධ්‍යස්ථානය සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී ගේ මඟපෙන්වීම යටතේ සංවිධානය කරන ලද අධ්‍යයන චාරිකාව සඳහා පැමිණි ශිෂ්‍ය භට නිලධාරීන් මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායක කර්නල් ඩීඒකේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් ඉතා උණුසුම්ව පිළිගන්නා ලදී. මෙම ශිෂ්‍ය භට නිලධාරින් "අභිමන් මුදුණත" රණවිරු ස්මාරකය සහ ශ්‍රී ලංකාවේ පැරණිතම රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අතීත මතකයන් ආවර්ජනය කිරීම සඳහා ඉදිකර ඇති කෞතුකාගාරයද නරඹන ලදී.

වසර 30ක් පුරා පැවති ත්‍රස්ථවාදී අරගලය යුදමය වශයෙන් පරාජය කිරීමේදී ශ්‍රී ලංකා පාබල හමුදාව ලැබු අත්දැකීම් පිළිබඳව අධ්‍යයනය කිරීම ඔවුන්ගේ මෙම සංචාරයේ මුලික අරමුණ විය. කර්නල් එම්ජීඒඑන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, කර්නල් එස්ඩී උදයසේන ආර්එස්පී, ලුතිතන් කර්නල් ජීඒඩීකේජී ගණේගොඩ ආර්එස්පී යුඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ, ලුතිතන් කර්නල් ඩබ්ලිව්කේඑස්පීඑම්ආර්ඒබී දොඩම්වල පීඑස්සී ශ්‍රීලපාහ, ලුතිතන් කර්නල් ටීඩබ්ලිව්ජීඩීඑම් අමරසිංහ ආර්ඩබ්ලිව්පී පීඑස්සී ශ්‍රීලපාහ, මේජර් එච්එම්එන්බී ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ, මේජර් එම්ඒඒපී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ හා මේජර් එච්ඒපේ ආරච්චි ආර්එස්පී පීඑස්සී

ශ්‍රීලපාහ යන නිලධාරීන් විසින් සාකච්ඡාව මෙහෙයවනු ලැබූ අතර, ශ්‍රී ලංකා පාබල හමුදා නිලධාරි නිවස්නයේ දී පවත්වන ලද දිවා භෝජන සංග්‍රහයට සහභාගී වූ මෙම ශිෂ්‍යභට නිලධාරීන් තම අධ්‍යයන චාරිකාව අවසන් කර රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් පිටව යන ලදී.











රෙම ශ්‍රීලපාහ පුවත්

# විශ්‍රාමික රණවිරු වැඩිහිටි නිවාසය කටාන හි පැවැති දානමය පුණ්‍යකර්මය

**විශ්‍රාම සුවයෙන් කටාන රණවිරු වැඩිහිටි නිවාසයේ නේවාසික ත්‍රිවිධ හමුදාවට අයත් විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් 2018.06.08 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් සිදුකරන ලද දානමය පුණ්‍යකර්මය**

## SLLI Seniors Salute ‘Tri-Service Veterans’ at Katana



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ මගපෙන්වීම මත තම මාතෘභූමිය වෙනුවෙන් උතුම් මෙහෙවරක යෙදී සිට මේ වන විට විශ්‍රාම සුවයෙන් කටාන රණවිරු වැඩිහිටි නිවාසයේ නේවාසික ත්‍රිවිධ හමුදාවට අයත් විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් 2018.06.08 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් දානමය පුණ්‍යකර්මයක් සිදුකරන්නට යෙදිණි. එහිදී විශ්‍රාමික රණවිරුවන් 22 ක් සහ එහි කාර්ය මණ්ඩලය සඳහා පූජ්‍ය උඩුගම්පොළ කෙහෙල්බද්දර ශ්‍රී බෝධිද්‍යාරාමාධිපති, ගම්පහ පහළගම විද්‍යාරවින්ද මහ පිරිවෙණේ නියෝජ්‍ය පරිවේණාධිපති, විචිත්‍ර ධර්ම කථික, කාව්‍ය ශ්‍රී, මහා විහාර වංශික, ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු විහාර පර්ශවයේ කර්ම වාගාචාර්ය ධර්මකීර්ති ශ්‍රී ජනානන්ද පූජ්‍යපාද මානිංගමුවේ ධම්මජෝති ස්වාමින් වහන්සේ විසින් හරවත් ධර්මානුශාසනාවක් පවත්වන ලද අතර, ඉන් අනතුරුව උන්වහන්සේ උදෙසා දානය පිළිගන්වන ලදී.

විශ්‍රාමික රණවිරුවන් හට කැලිප්සෝ සහ අඩිරිද්ම සංගීත රසාස්වාදය අත්විඳීමට ඉඩ සළසා දුන් අතර, එමඟින් ඔවුනගේ තනිකම කාන්සිය මොහොතකට මඟහැරවීමට කටයුතු කරන ලදී. පසුව රෙජිමේන්තු අධිපති තුමන් ඇතුලු මෙම දානමය පුන්‍යකර්මය සඳහා සහභාගිවූ සියලුම නිලයින්, විශ්‍රාමික රණවිරුවන් සමඟ දිවා භෝජන සංග්‍රහය භුක්තිවිඳ සුහද පිළිසඳරක නිරතවීමෙන් පසු රෙජිමේන්තු අධිපති තුමන්, විශ්‍රාමික රණවිරුවන් හට හා එහි කාර්යමණ්ඩලයට ත්‍යාග ප්‍රදානය කිරීමද සිදුකරන ලදී.

විශ්‍රාමික සුවයෙන් පසුවන මෙම රණවිරුවන් හා එක්ව ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින් ගතකල මෙම හෝරා කිහිපය ඔවුන්ගේ දිවියේ නොමැකෙන මතකයක්ව පවතිනු නොඅනුමානය.

මෙම අවස්ථාව සඳහා බ්‍රිගේඩියර් ජේආර් අම්පෙමොහොට්ටි ආර්එස්පී, බ්‍රිගේඩියර් කේජේ ජයවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් යන ජ්‍යෙෂ්ඨ නිලධාරින්ද, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, කර්නල් එසිපී විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, නියෝජ්‍ය සේනාවිධායක කර්නල් ඩීඒකේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ මෙන්ම කණිෂ්ඨ නිලධාරීන් සහ රෙජිමේන්තු සැරයන් මේජර් අතුලු සෙසුනිලයින් විශාල පිරිසක්ද සහභාගී විය.











# රෙජිමේන්තු නිලධාරි පුහුණු දිනය

**2018 වසරේ දෙවන කාර්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් 195 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි මස 14 වැනි දින රෙජිමේන්තු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නිලධාරි පුහුණු දිනය රෙජිමේන්තු පරිශ්‍රයේදී පවත්වන ලදී.**





ශ්‍රී ලංකා යුද හමුදාවේ සෑම රෙජිමේන්තුවකටම අයත් නිලධාරීන් සඳහා වසරකට පුහුණු දිනයන් හතරක් එක් එක් රෙජිමේන්තු මට්ටමින් පැවැත්වීමට කටයුතු කරන ලෙස යුද හමුදා මූලස්ථානය වෙතින් උපදෙස් ලබාදී ඇති අතර, එම පුහුණු සැළසුමට අනුව මෙම පුහුණු දිනය සැළසුම් කරන ලදී.

මෙහිදී රෙජිමේන්තු අධිපතිතුමන් විසින් පැමිණි සිටි සියලුම නිලධාරීන් හට මෙම පුහුණුවීම් දිනයෙහි අරමුණ පැහැදිළි කරදීමෙන් අනතුරුව නිලධාරීන්ගේ යුද හමුදාවේ ඉදිරි අනාගතය සැළසුම් කර ඇති ආකාරය හා වෘත්තීය හැකියාවන් වර්ධනය කරගතයුතු ආකාරය පැහැදිළි කරමින් අපේක්ෂිත ප්‍රමිතිය වර්ධනය කිරීම සඳහා නිසි මඟපෙන්වීම හා පුහුණුව තුලින් ඉටුකල හැකි සංකල්පමය ක්‍රියාවලියක් බවත්, ඒ සඳහා මූලික පාඨමාලා, මැද පෙළ පාඨමාලා හා උසස් පුහුණු පාඨමාලා මගින් භාෂාව, පෞද්ගලික හැකියාවන්, දැනුම, නායකත්ව ගුණාංග වර්ධනය කර වෘත්තිමය නිලධාරියෙකු බිහිකල හැකි බවත් සඳහන් කරමින් හරවත් දේශනයක් පැවැත්විය.

පුහුණු දිනයේදී ලුතිතන් කර්නල් එම්ඩීඑස්එන්එස් කරුණාරත්න පීඑස්සී ශ්‍රීලපාහ විසින් හරවත් දේශනයක් සිදු කල අතර, එදින සන්ධ්‍යාවේ නිලධාරීන් සඳහා ක්‍රීඩා ඉසව් පැවැත්වීමෙන් පසු රෙජිමේන්තු නිලධාරි නිවස්නයේ ආරාධිත දේශකයෙකු වශයෙන් පැමිණි ආචාර්යය හරින්ද විදානගේ මහතා විසින් ගෝලීය ආරක්ෂක පරිසරය යන මාතෘකාව යටතේ හරවත් දේශනයක් පවත්වැත්වීය. පුහුණු දිනයට සහභාගී වූ සියලුම නිධාරීන් හා ආරාධිත දේශකයා වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා සාර්ථක පුහුණු දිනයක නිමාව සනිටුහන් කරන ලදී.



# දැයෙන් සමුගත් බ්‍රිගේඩියර් ඊඊආර් අබේසිංහ (විශ්‍රාමික) කේඑස්වී





මීගමුව ප්‍රභූ පෙළපතකට හිමිකම් කියන අබේසිංහ මැතිතුමා සහ එම මැතිණියට දාව පවුලේ එකම දරුවා ලෙසින් 1926 අප්‍රේල් මස 28 වන දින ඇලෙක්සැන්ඩර් එඩ්මන්ඩ් රාජපක්ෂ අබේසිංහ නම් දරුවා උපත ලැබී ය. කොළඹ ශාන්ත පීතර විද්‍යාලය හා රාජකීය විද්‍යාලයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය හැදෑරූ ඔහු පාසල් වියේදී දක්ෂ ක්‍රිකට් හා ටෙනිස් ක්‍රීඩකයෙක් ද විය.

1954 පෙබරවාරි 01 වන දින ශ්‍රී ලංකා යුද හමුදාවේ ස්වේච්ඡා බළසේනාවට ශිෂ්‍ය භට නිලධාරියෙකු ලෙස එක්වී මූලික යුද පුහුණුව සාර්ථකව නිමකිරීමෙන් පසු 1954 මාර්තු මස 01 වන දින දෙවන ලුතිතන්වරයෙකු ලෙස අධිකාරිය ලබාගෙන 2 වන ලංකා පාබල බළඇණියට එක්වන ලදී. ඉන්පසු දිවයිනේ විවිධ ප්‍රදේශවල රාජකාරි කරන අතරතුර එක්සත් රාජධානියේදී කණ්ඩභාර නිලධාරි පාඨමාලාව හදාරණ ලදී.

2 ලුතිතන් ඊඊආර් අබේසිංහ 1957 පෙබරවාරි 01 වන දින ලුතිතන් නිලයටත්, 1962 ජූලි 04 වන දින කපිතන් නිලයටත්, 1970 ජූලි 04 මේජර් නිලයටත් නිල උසස්වීම් ලබන ලදී. 1980,1983 සහ 1996 වසරවලදී ලුතිතන් කර්නල්, කර්නල් හා බ්‍රිගේඩියර් යන නිල උසස්වීම් ලැබූ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2 වන බළඇණිය ලංකා පාබල හමුදාවේ විධායක අධිකාරි, 2වන අණදෙන නිලධාරි, 30 වන අණදෙන නිලධාරි යන තනතුරු හොබවන ලදී. තවද, 1965 වර්ෂයේ ආණ්ඩුකාර හා අග්‍රාණ්ඩුකාරවරුන්ගේ අතිරේක අධිසහායක ලෙස ද, ස්වේච්ඡා බලසේනාවේ 12 වන නියෝජ්‍ය සේනාවිධායක ධූරය ද, ජාතික ශිෂ්‍යභට බලකායේ අතිරේක අධ්‍යක්ෂක ධූරයක් ද හෙබවීය.

දේශය වෙනුවෙන් ඉටුකල කීර්තිමත් නොකළැල් සේවාව උදෙසා කාර්යක්ෂම සේවා විභූෂණය, ශ්‍රී ලංකා යුදහමුදා 25 වන සංවත්සරය, දීර්ඝසේවා, ජනාධිපති පදවිප්‍රාප්ති, ස්වේච්ඡා බළසේනා ශතසංවත්සරය යන පදක්කම් සහ පළඳනාවලින් පිදුම් ලැබී ය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් අවුරුදු 34 ක සේවා කාලයකින් පසු විශ්‍රාම යන ලද මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් ශ්‍රී ලංකා පාබල හමුදා වයිට් හැකල් සගරාවේ උපදේශක මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ අතර, ප්‍රවීණ ඉංග්‍රීසි මාර්ගෝපදේශකයෙකු ලෙස තම සේවය ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව වෙත ලබා දෙන ලදී.

2018 ජූනි මස 03 වන දින සදහටම අපගෙන් සමුගන්නා ලද බ්‍රිගේඩියර් ඊඊආර් අබේසිංහ කේඑස්වී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ අවසන් කටයුතු යුද හමුදා ගරු බුහුමන් සහිතව 2018 ජූනි මස 06 වන දින මීගමුව පොදු සුසානභූමියේදී සිදුකරන ලදී. මෙම අවමංගල්‍ය උත්සවය සඳහා යුද හමුදාවෙන් විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ යුද හමුදාවේ දැනට සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ සහභාගීත්වයෙන් කාල තුවක්කු වෙඩිමුර 11ක් සහ වර්ණ ධජ ඝණයකින් සමන්විත යුද්ධ හමුදා සම්මාන පෙළපාලියකින් අභිමානවත් ලෙස සිදුකරන ලදී. අප අතරින් සදහටම සමුගත් අභීත සෙන්පතියාණෙනි.... හිරු නැගඑන මොහොතේදීත්, හිරු බැසයන මොහොතේදීත් අප ඔබ නිරන්තරයෙන්ම සිහි කරන්නෙමු.... විරුවාණෙනි ඔබට නිවන් සුව...!!!



# ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ මඞ්ඤොක්කා දන්සල 5 වැනි වරටත්





බුදුරදුන්ගේ තෙමඟුල සිදුවු වෙසක් දින සමරමින් පාබල හමුදා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව විසින් පස්වෙනි වරටත් සංවිධානය කරන ලද මහා මඤ්ඤොක්කා දන්සල මෙවරත් සිල්වර් බියුගල් ආපන ශාලාව අසල දී පවත්වන ලදී. මෙම මඤ්ඤොක්කා දන්සල 2018.04.30 වන දින පස්වරු 04.30ට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණී තුෂාරි කුලතුංග මැතිණිය හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් විවෘත කරන ලදී. තවද මෙම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් හා පාබල හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් බැතිසිතින් සහභාගී වන ලද අතර, ප්‍රදේශයේ සහ පිටපළාත් වලින් වෙසක් සිරි නැරඹීම සඳහා පැමිණි 10,000 අධික ජනතාවක් ද මෙම දන්සල වෙත පැමිණියහ.



විශේෂාංග




# LEADERSHIP

මේජර් සාගර වීරසිංහ විසිනි

# නායකත්ව ගුණාංග හා මුලධර්මයන්

ආයතනයක හෝ පාසලක ප්‍රධානියාට සිය සංවිධානයේ අරමුණ මුදුන්පමණුවා ගැනීම සඳහා සිය සංවිධානය මෙහෙයවන හෙයින් එවැන්නෙකු නායකයෙකු ලෙසින් හඳුන්වනු ලබයි.

## නායකත්වය = LEADERSHIP

L - love - **ආදරය**
E - equality - **සමානාත්මතාවය**
A - altruism - **පරාර්ථකාමීත්වය**
D – discipline - **විනය**
E – equity - **සාධාරණත්වය**
R– Respect - **ගෞරවය**
S – Service **සේවය**
H – Harmony - **සමගිය**
I – Indrpendence - **ස්වාධීන බව**
P – Prtnerp - **හවුල් බව**

## නායකත්වය ලැබෙන අවස්ථා

1. උරුමයෙන්
2. අහම්බෙන්
3. අවස්ථානුකූලව
4. මහජන මතයෙන්
5. සටන් කර ජය ලැබීමෙන්
6. විප්ලවයන් වලින්

## ලෝකයේ බිහිවිය හැකි විවිධ නායකයින්

1. දේශපාලන නායකයින්
2. ආගමික නායකයින්
3. කැරලි නායකයින්
4. ත්‍රස්තවාදී නායකයින්
5. හමුදා නායකයින්

## නායකත්ව මුලධර්ම

හමුදා නායකත්ව මුලධර්ම අතීතයේ සිට පැවත ආ අතර නායකත්ව මූලධර්ම මඟින් නායකත්වය සඳහා විශිෂ්ඨ මඟපෙන්වීමක් සහ ඒ සදහා ප්‍රවිෂ්ඨ වීමක් මෙන්ම පහත මූලධර්ම තුලින් නායකත්ව හැකියාවක් වර්ධනය කර ගත හැක.

අ. ස්වකීය අවබෝධය හා ස්වකීය දියුණුව
ආ. උපක්‍රමික හා කාර්මික නිපුණත්වය
ඇ. වගකීම භාරගෙන එය පවරාගෙන ක්‍රියාකිරීම
ඈ. කාලොචිත හා යහපත් තීරණ ගැනීම
ඉ. ආදර්ශමත් වීම
ඊ. අණුගාමික සෙබලුන් අවබෝධ කර ගැනීම හා ඔවුන්ගේ සුබසාධනය ගැන නිරතුරුවම සොයා බැලීම
උ. සෙබලුන් දැනුවත් කිරීම
ඌ. සෙනින් තුල වගකීම් පිළිබඳ හැඟීම් ඇතිකිරීම
එ. කාර්ය වටහා ගත් බවට අධීක්‍ෂණය වු බවටත් සාර්ථකව නිමකල බවටත් තීරකර ගැනීම
ඒ. කණ්ඩායමක් ලෙස පුහුණු කිරීම
ඔ. නායකයාගේ ඒකකයේ වෘත්තීමය හැකියාවන් මත පමණක් කාර්යන් පැවැරීම

## නායකත්ව ගුණාංග

නායකත්ව ගුණාංග දියුණු කර ගැනීමෙන් සාර්ථක නායකයෙකු විය හැකය.

1. එඩිතරභාවය
2. පැවැත්ම
3. යහපත් තීරණ ගැනීම
4. විශ්වාසවන්තභාවය
5. දරාගැනීමේ ශක්තිය
6. උද්යෝගයමත් බව
7. නිහතමානී බව
8. ප්‍රබෝධමත්කම
9. ස්වාධීනව ක්‍රියා කරීමේ හැකියාව
10. අවංක බව
11. විනිශ්චය කිරීමේ හැකියාව
12. සාධාරණත්වය
13. දැණුම
14. ප්‍රියමනාපභාවය
15. පක්‍ෂපාතීභාවය
16. පරාර්ථකාමීභාවය



බළඇණි පුවත් | ශ්‍රීලපාහ

# 68 වැනි සංවත්සරය සැමරූ 1 ශ්‍රීලපාහ



1 ශ්‍රීලපාහ ඒකකය 1950 මැයි මස 12 වන දින ස්ථාපනය කල අතර, 2018.05.12 වන සිය 68 වන සංවත්සරය අණදෙන නිලධාරී මේජර් කේඩබ්ඩබ්කේ කරුණාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ මඟපෙන්වීම යටතේ මුල්ලියාවේලි කඳවුරේදී අභිමානවත් ලෙස පවත්වන ලදී.

මෙම ඒකකය වෙත 1954 වසරේ අප්‍රේල් මස 21 දින අති උත්තම රාජවංශික **II** වන එලිසබෙත් මහා රාජිණිය විසින් ඒකකය වෙත රාජිණී වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රධානය කරීමෙන් පසුව 1978 ඔක්තෝබර් මස 10 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පූර්ණ බලැති විධායක ජනාධිපති ගරු ජේආර් ජයවර්ධන ශ්‍රීමතාණන් විසින් ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය කරන ලද අතර, 2015 ඔක්තෝබර් මස 26 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති හා සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් විසින් වසර 37 කට පසු ජනාධිපති වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රතිප්‍රදානය කරන ලදී.

වසර ගණනාවක් ත්‍රස්ථවාදීන් විසින් රැකගෙන සිටි ඔවුන්ගේ මුහමාලේ පළමු ආරක්ෂක වළල්ල නොකඩවා දින 05 ක සටනකින් පසු අත්පත්කර ගත් මෙම බළඇණිය ඉන් නොනැවති උතුරු මානුෂිය මෙහෙයුමට පීවයක් ලබා දෙමින් 55 සේනාංකය යටතේ නගර්කෝවිල්, පලෙයි, කෙවිල්, චුන්ඩිකුලම්, චලෙයි හරහා පුදුමාතලන් අවසන් පස් බැම්ම දක්වා ජයග්‍රාහි ලෙස ගමන් කරන ලදී. මේ වනවිට 59 වන සේනාංකය යටතේ 592 බළසේනා මුලස්ථානයට අනුයුක්තව මුලතිව් මුල්ලියාවේලි කඳවුරේ ස්ථානගතව රාජකාරීන් ඉටු කරනු ලබයි.

2018.05.12 වන දින අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් හා වර්ණ ධජ සහිත සම්මාන පෙළපාලියක් පිරිණාමන ලද අතර, රුක් රෝපණ වැඩසටහනින් පසු සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පැවැත්වීය. එදින රාත්‍රියේ 12 ශ්‍රීලපාහ සංගීත කණ්ඩායම සමඟ සියලු නිල සුහද හමුවක්ද පවත්වා සංවත්සර දිනය නිමාවට පත් කරන ලදී.



# 2 [සෙව්] ශ්‍රීලපාහ නිලධාරි ක්‍රීඩා තරඟ




යාපනය අර්ධද්වීපයේ සියලුම ඒකකයන් සහභාගීත්වයෙන් සංවිධානය කරනු ලැබූ බැඩ්මින්ටන් තරඟාවලිය 2018.05.04 දින පැවැත්වූ අතර, එම තරඟවලියේ විවෘත කාණ්ඩය නියෝජනය කල මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් පීඩබ්ඒචන්චන්එස්කේ වීරසිංහ ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් එහි ශූරතාවය ලබාගත් අතර, විවෘත යුගල කාණ්ඩයේ තරඟය සඳහා ද සහභාගී වූ අණදෙන නිලධාරි හා දෙවන අණදෙන නිලධාරි මේජර් ඒජීචන් ධනසිරි ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරින් එහි අනුශූරතාවය ලබාගන්නා ලදී.

# 2 [සෙව්] ශ්‍රීලපාහ ඒකකය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරින් සිදුකළ සංචාරයන්

512 බළසේනාධිපති කර්නල් ජේඑම්සී ජයවීර ආර්එස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී හා 51 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඩබ්ලිව්එම්පීආර් සෙනෙවිරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 2(සෙව්) ඒකක සංචාරයන් ඉකුත් මැයි මස 14 සහ 16 දිනවලදී සිදුවූ අතර, මෙම සංචාරයන් තුලදී යුද්ධ හමුදා පිළිවෙතට අනුකූලව යුද්ධ හමුදා සම්මාන මුරයක් පිරිනමමින් ඉතා හරසරින් පිළිගැනීමට අණදෙන නිලධාරී මේජර් පීඩබ්ඒචන්චන්එස්කේ වීරසිංහ ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සියලු කටයුතු සූදානම් කරන ලදී.





# 31 වැනි සංවත්සරය සැමරූ 4 ශ්‍රීලපාහ



4 ශ්‍රීලපාහ ඒකකය 2018.05.05 වන දින සිය 31 වන සිය සංවත්සරය අභිමානවත් ලෙසින් සමරන ලදී.

දශක තුනක් පුරා පැවති එල්ටීටීඊ ත්‍රස්ථවාදය මුලිණුපුටා දැමීම පිණිස අභීත නායකයින් 18 දෙනෙකු යටතේ අවසන් මානුෂීය මෙහෙයුම තෙක් සක්‍රීය දායකත්වය ලබා දෙන ලදී. මේ වන විට 53 වන සේනාංකය යටතේ යුද්ධ හමුදාධිපති තුමන්ගේ අතිරේක ප්‍රහාරක බළඇණියක් ලෙස මෙම බළඇණිය තම සේවය ඉටුකරනු ලබයි.

31 වන සංවත්සරයට සමගාමීව අණදෙන නිලධාරි මේජර් අයිආර් හේවාපතිරණ ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ සියලුම නිලයින් විසින් ඒකකයට අනුයුක්තව රාජකාරි කළ මාතෘභූමිය වෙනුවෙන් ජීවිතය පූජා කළ නිලධාරින් 23 ක් සහ සෙසුනිළයින් 357 ක් සිහිපත් කරමින් පිං අනුමෝදන් කර ආබාධිත තත්වයට පත්ව නිවෙස්ගතව හා රෝහල් තුළ ප්‍රතිකාර ගනිමින් සිටින නිලධාරින් 51 ක් සහ සෙසුනිලයින් 423 ක් වෙනුවෙන් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමින් දැනට රාජකාරියේ නියුතු සියලුම නිලයින් හට ද සෙත්පතා 2018.05.05 වන දින නවගමුව පුරාණ රජමහා විහාරස්ථානයේ බෝධි පූජා පිංකමක් පවත්වන ලදී. එදිනම මහා පත්තිණි දේවාලයේදී දේව පූජාවක් පැවැත්වූ අතර, ඒකක අණදෙන නිලධාරි වෙත අභිමානවත් සම්මාන මුරයක් ද එදින පිරිනමන ලදී.





# හදිසි අපදාවන්ගෙන් විපතට පත් ජනතාව මුදවාලීමේ 6 ශ්‍රීලපාහ මෙහෙයුම



මෝසම් සුලං සක්‍රීයවීමත් සමඟම රත්නපුර දිස්ත්‍රික්කයේ ඇතිවූ ගංවතුර හා වෙනත් අපදා තත්වයන්ගෙන් සාමාන්‍ය ජනතාව මුදවා ගැනීමේ හා සහන සැලසීමේ රාජකාරිවල නිරත වෙමින් 6 ශ්‍රීලපාහ ඒකකය ජාතික කර්තව්‍යයක නිරත විය.

ගංවතුර පැවති රත්නපුරය දිස්ත්‍රික්කයේ රත්නපුර සමන් දේවාලය, ගොඩිගමුව මුස්ලිම් පල්ලිය මාර්ගය හා සීවලී ක්‍රීඩාංගනය අසළ මහා මාර්ගය ජලයෙන් යටවීමෙන් අඩාලවූ මහජනතාවගේ දෛනික ගමනා ගමන කටයුතු බෝට්ටු යොදා ගනිමින් සිදුකර දෙන ලදී. කුරුවිට නායකොස්ගම කන්ද උඩ ප්‍රදේශය නාය යෑමෙන් පසු අවහිර වූ මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරිය සමඟින් එය යථාතත්වයට පත් කරන ලදී. කැඩීයාමේ අවධානමකට ලක්ව තිබූ ඇලපාත වැව් බැම්ම අධික වර්ෂාව ද නොතකා රජයේ ආයතන සමඟ එක්ව වැලිකොට්ටා අතුරා ආරක්ෂිත තත්වයට පත්කිරීම සහ අවහිරව පැවති එම වැවෙහි පිටවාන සුද්දපවිත්‍ර කර යථා තත්වයට පත්කර එමඟින් වූ අවධානම් තත්වය සමනය කිරීමට ද මෙම ඒකක භඨ පිරිස් කටයුතු කළහ. එපමණක්ද නොව ගංවතුර තත්වයකින් පසු පානීය ළිං සුද්දපවිත්‍ර කරදීමේ වැඩපිළිවෙලක් ද 6 ශ්‍රීලපාහ ඒකක භඨ පිරිස් විසින් සිදුකරන ලදී. අයහපත් කාලගුණික තත්වය මත ප්‍රදේශයේ ඇති අවධානම් තත්වය පිළිබඳව නිරතුරුවම ආදාල ආයතනයන් දැනුවත් කරමින් ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම නිසා ප්‍රදේශයේ ඇතිවූ කාලගුණික උවදුරුවලින් මහජනතාව මුදවාගැනීමට 6 ශ්‍රීලපාහ ඒකකය සිදුකල මෙහෙයුම පැසසුමට ලක්වන්නකි.






# 7 ශ්‍රීලපාහ 11 වන අණදෙන නිලධාරි තුමන්ගේ සම්ප්‍රාප්තිය





වර්ෂ 1992 නොවැම්බර් මස 20 වන දින සුබ මොහොතින් යාපා පටුන ආසන්නයේ සුන්දර මණ්ඩතිව් දූපතේ ස්ථාපනය කරන ලද 7 ශ්‍රීලපාහ බළඇණිය නිත්‍ය බළඇණියක් වශයෙන් මේ වනවිට වසර 26 කට ආසන්න කාලයක් අණදෙන නිලධාරින් දස දෙනෙකුගේ මඟපෙන්වීම යටතේ දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන් හි ක්‍රියාන්විත රාජකාරිවල නිරතවූ මෙම බළඇණිය කිලිනොච්චි ප්‍රදේශයෙ ස්ථානගතව රාජකාරි කරනු ලබයි. 7 ශ්‍රීලපාහ ඒකකයේ 11 වන අණදෙන නිලධාරි ලෙස 2018 අප්‍රේල් මස 23 වන දින මේජර් කේඑම්එම්කේබී කඩවතමුදලි ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් පැමිණි අතර, පොල්තෙල් පහන දල්වා මහා සංඝ රත්තයේ ආශීර්වාදය හා පිරිත් දේශන මධ්‍යයේ අණදෙන නිලධාරි ධූරයේ රාජකාරි භාරගන්නා ලදී.

යුද්ධයේදී මියගිය හා අතුරුදන් වූ රණවිරුවන් සිහිකළ අණදෙන නිලධාරි තුමන් ආබාධිත රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළ අතර, ඒකකයේ සියලුම නිලයින් අමතා කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කරන ලද්දේ තම ධූරයේ පළමු පියවර සිහිවීම පිණිසයි. 7 ශ්‍රීලපාහ ඒකකයේ නව අණදෙන නිලධාරි ධූරයේ වැඩභාරගත් ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමණි ඔබගේ ඉදිරි ගමනට රෙජිමේන්තු අධිපති ප්‍රමුඛ සියලුම නිලයින්ගේ සුබාශිංසන මෙසේ පිරිනමන්නෙමු.



# ගම්පහ දිස්ත්‍රික් බළප්‍රදේශයේ අයහපත් කාළගුණික තත්වය හේතුවෙන් ආපදා ඇතිවිය හැකි ස්ථානයන් පිළිසකර කිරීම සඳහා උරදුන් 8 ශ්‍රීලපාහ



2018.05.21 දින සිට 2018.05.27 දින දක්වා කාලය තුල ගම්පහ දිස්ත්‍රීක් බළප්‍රදේශයට බලපාන ලද අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් අවදානමට ලක්වුණ මල්වාන, පවුරු ඇල, පිටාර ගැලීම නිසා ඉවුරු කැඩීයාමේ අවදානම සහ කැළණි ගඟ පිටාර ගැලීම හේතුවෙන් බියගම සහ කඩුවෙල ප්‍රධාන මාර්ගය යා කෙරෙන පාලමේ වම් ඉවුර ඛාදනය වීමෙන් ඇතිවූ ආපදා තත්වයන් වළක්වාලීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක වූ 8 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි මේජර් එන්ඩබ්ලිව්ඩීඒ නානායක්කාර ආර්එස්පී යූඑස්පී ශ්‍රීලපාහ විසින් කඩිනමින් එම ආපදා තත්වය පාලනය කිරීමට කටයුතු කරන ලදී.

මල්වාන පවුරු ඇලෙහි ඉවුර ඛාදනයවී කැඩීයාමේ අවදානම් තත්වයකට පත්ව තිබීම හේතුවෙන් එම ඉවුර රාත්‍රී කාලයෙදී කැඩී ගියහොත් 413 මල්වාන සහ 281 සී මල්වාන යන ග්‍රාම සේවා වසම්වල පවුල් 1000ක් මිනිස් ජීවිත හා දේපළ වලට විශාල වශයෙන් හානි සිදුවීමේ අවධානමකට ලක්වෙමින් තිබිණ. එම ආපදා තත්වය පාලනය කිරීම සඳහා අණදෙන නිලධාරි ඇතුලු භට පිරිස් ගම්පහ දිස්ත්‍රීක් භාර ආපදා කළමණාකරණ නිලධාරින් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2018.05.21 හා 2018.05.22 යන දෙදිනයන්හි වැලි කොට්ටා 470ක් යොදා පවුරු ඇල ඉවුර ප්‍රතිසංස්කරණය කරන ලදී.

ජා-ඇලේ වම් ඉවුරෙන් ජලය පිටාර ගැලීම හේතුවෙන් එම ඉවුර කැඩීයාමේ අවදානමක් ඇතිවූ අතර, වැලි කොට්ටා යොදා එයද යථා තත්වයට පත් කළ 8 ශ්‍රීලපාහ භට පිරිස් කැළණි ගඟ පිටාර ගැලීම හේතුවෙන් බියගම සහ කඩුවෙල යා කෙරෙන ප්‍රධාන මාර්ගය හරහා වැටී ඇති පාලමේ වම්පැති ඉවුර අඩි 25ක පමණ ප්‍රමාණයක් සේදී ගොස් වාහන ගමනාගමන කටයුතු ඇණ හිටීම හේතුවෙන් මෙම ඒකකය විසින් නාවික හමුදාව හා ගුවන් හමුදාවේ සහය ඇතිව 2018.05.24 වන දින එම පාලම කඩිනමින් සකසා ගමනාගමන කටයුතු සඳහා යථාතත්වයට පත් කරන ලදී.

# කොළඹ යුද හමුදා රෝහලේ නේවාසික රෝගීන්ට 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සංවිධානයෙන් සුමධුර ධර්මදේශනාවක්



යුද හමුදා බෞද්ධ බළමණ්ඩලයේ උපදෙස් මත කොළඹ යුද හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ ඉක්මන් සුවයත්, මානසික සුවයත් ප්‍රාර්ථනාකරමින් 2018.05.29 වැනි දින අධි පොසොන් පසළොස්වක පොහෝ දින නිමිතිකොටග නිමින් ඒකක අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ පූර්ණ මඟපෙන්වීම යටතේ ධර්මදේශණයක් සංවිධානය කරන ලදී. මෙම සුමධුර ධර්මදේශනය සඳහා රොහලේ නේවාසික රෝගීන් 70 දෙනෙකු පමණ සහභාගී වූ අතර, පූජ්‍ය දෙණියායේ පඤ්ඤාලෝක ධම්මරක්ඛිත ස්වාමීන්වහන්සේ විසින් ධර්මදේශනය පවත්වන ලදී. මෙම ධර්මදේශන වැඩසටහන සඳහා සහභාගී වූ නේවාසික රෝගීන් ඇතුලු රෝහල් කාර්යමණ්ඩලය 9 (සෙව්) ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුලු සංවිධාන කමිටුව වෙත තම කෘතඥතාවය පුද කළහ.

# ශ්‍රීලංයුහසෙව්බ නියෝජ්‍ය සේනාවිධායක තුමන්ගේ 9 (සෙව්) ශ්‍රීලපාහ සංචාරය



ශ්‍රීලංයුහසෙව්බ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2018 ජුනි මස 19 වන දින 9 (සෙව්) ශ්‍රීලපාහ සංචාරයක නිරත විය. ඒකකයෙන් ලබාදුන් සම්මාණ මුරයෙන් පසු ඒකක අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ විසින් නියෝජ්‍ය සේනාවිධායක තුමන් ඉමහත් හරසරින් පිළිගන්නා ලදී.

ඒකකයේ නවතමයෙන් ඉදිකරන ලද බුද්ධ මන්දිරය හා බෝධි ප්‍රාකාරය ආගමික වතාවත් සිදුකිරීමෙන් පසු නියෝජ්‍ය සේනාවිධායක තුමන්ගේ සුරතින් ඒකකයේ ආගමික කටයුතු සඳහා එදින නිරාවරණය කරන ලදී.

බළඇණි පුවත් 10 ශ්‍රීලපාහ

# 10 ශ්‍රීලපාහ ඒකකයේ දා හතර වන නියමුවාණන්






මල්ලාවි - පාලිනගර් ප්‍රදේශයේ ස්ථානගතව සිටින මෙම ඒකකය, අණදෙන නිලධාරීන් 13 දෙනෙකුගේ නායකත්වය යටතේ රාජකාරි මැනවින් ඉටු කර ඇත. මෙම බළඇණියේ 14 වන නව අණදෙන නිලධාරි ලෙසින් පැමිණි මේජර් එච්එම්එන්බී ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් අභිමානවත් කඳවුරු මුරයකින් පිළිගැනීමෙන් අනතුරුව සුබ මොහොතින් තම ධූරයේ රාජකාරි ආරම්භ කරන ලදී.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි 1996.01.03 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් පාඨමාලා අංක 44 යටතේ යුධ හමුදා විද්‍යා පීඨය දියතලාව වෙත එක්වී වසර දෙකක සාර්ථක පුහුණුවෙන් පසු 2/ලුතිතන් වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුලත් කිරීමෙන් පසු 3 ශ්‍රීලපාහ ඒකකය වෙත අනුයුක්ත කර ක්‍රියාන්විතයන්ට තම සක්‍රීය දායකත්වය ලබාදෙන ලදී. එම ඒකකයේ බණ්ඩ භාර නිලධාරි, බුද්ධි නිලධාරි හා නිලධාරි අණදෙන ලෙස හා වන්නි හේවා බළඇණියේ බුද්ධි නිලධාරි, විධායක ආධිකාරි ලෙසද හා 1 ශ්‍රීලපාහ ඒකකයයේ දෙවන අණදෙන නිලධාරියෙකු ලෙසද රාජකාරි සිදුකර ඇත. 10 ශ්‍රීලපාහ ඒකකයේ විවිධ තනතුරු හොබවා අණදෙන නිලධාරි වශයෙන් පත්වීමට තරම් උතුම් භාග්‍යයක් අත්පත් කරගත් අතර, ඒකකයේ රාජකාරි කල කාලයේදී බණ්ඩ භාර නිලධාරි, කණ්ඩායම් භාර නිලධාරි අණදෙන, ක්‍රියා හා පුහුණු නිලධාරි හා දෙවන අණදෙන නිලධාරි වශයෙන් ද රාජකාරීන් ඉටුකල මෙම නිලධාරි යුද හමුදා මූලස්ථානයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන කාර්යාලය ප්‍රමානි 111, 593 බළසේනා මේජර්, යුසේලේශා මානි 11 (විනය) යන විවිධ තනතුරු ද හොබවා ඇත.

තම සේවා කාලය තුල සපුපා අම්පාර වෙතින් විධායක අධිකාරි පාඨමාලාව, අණ හා මාණ්ඩලික විද්‍යාලය - බටලන්ද වෙතින් මාණ්ඩලික නිලධාරි පාඨමාලාව මෙන්ම විදේශීය පාඨමාලාවන් අතර ආර්එස්ඕ පාඨමාලාව - ඉන්දියාව, තරුණ නිලධාරි පාඨමාලාව - ඉන්දියාව වෙතින් හදාර ඇති අතර, තවද හයිටිහි රාජ්‍යයේහි එක්සත් ජාතීන්ගේ සාමසාධක මාණ්ඩලික නිලධාරි ලෙස ද රාජකාරි කල අත්දැකීම් වලින් හෙබි නිලධාරියෙකි. නව අණදෙන නිලධාරිතුමනි ඔබගේ ඉදිරි ගමන සාර්ථක වේවායි අපගේ පැතුමයි.

# 51 වන සේනාංකාධිපති තුමන්ගේ 11 ශ්‍රීලපාහ ඒකක සංචාරය



2018.05.17 වන දින 11 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරයක නිරත වූ 51 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඩබ්එම්පීආර් සෙනෙවිරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙත කඳවුරු මුරයක් ලබාදෙමින් ඒකකයේ අණාදෙන නිලධාරි තුමන් විසින් ඉතා උණුසුමින් පිළිග න්නා ලදී. හඨ පිරිස් අමතා ඒකක පරිශ්‍රයේ අඹ පැළයක් රෝපණය කිරීමෙන් පසු මෙම නිලධාරි තුමන් තම සංචාරය නිමාවට පත් කර 11 ශ්‍රීලපාහ කඳවුරෙන් නික්ම යන ලදී.

# 11 ශ්‍රීලපාහ ඒකකයේ නවතමයෙන් ඉදිකරන ලද නිවාඩු නිකේතනය ශ්‍රීලපාහ රෙජිමේන්තු සේනාවිධායක තුමන් සුරතින් විවෘත වේ.



අණාදෙන නිලධාරි තුමන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 11 ශ්‍රීලපාහ ඒකකයේ සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉතාමත් කෙටි කාලසීමාවක් තුලදී වැඩ අවසන් කරන ලද නිවාඩු නිකේතනය 2018.04.10 වන දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සුරතින් සුභ මොහොතින් විවෘත කරන ලදී.





# වෙසක් සිරියෙන් ආලෝකමත් වූ 12 ශ්‍රීලපාහ

2662 වැනි ශ්‍රී සම්බුද්ධ ජයන්තිය පෙරදැරි කරගෙන මෙවර වෙසක් උත්සවය ඉතා අභිමානවත් අයුරින් සැමරීමට 12 ශ්‍රීලපාහ ඒකකය කටයුතු සංවිධානය කරන ලදී. අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්එච්එස්පීඑස් ද සිල්වා ආර්එස්පී යූඑස්පී ශ්‍රීලපාහ ගේ මඟපෙන්වීමෙන් සියලු නිලධාරින් සහ සෙසුනිලයින්ගේ උනන්දුවෙන් හා කැපවීමෙන් බුදුන් වහන්සේගේ තෙමඟුල සිහිපත් කරමින් ආමිස හා ප්‍රතිපත්ති පූජාවන් රැසක් සිදු කිරීම මෙදින සිදුවිය. වෙසක් පොහෝ දින බළඇණි මුලස්ථාන පන්සල් භූමියට ඒකරාශී වූ ඒකකයේ සියලුම නිලයින් ත්‍රිවිධ රත්නයෙහි පිහිටා උතුම් වූ බුදුගුණ සිහිපත් කරමින් පංචසීලය සමාදන් වී මියගිය රණවිරුවන් හට පිං ප්‍රාර්ථනා කර රටටත් සියලුම රණවිරුවන්ටත් ආශීර්වාද පතා බෝධි පූජා පිංකමක් සිදුකරන ලදී.

මෙවර වෙසක් උළෙලේ ආකාර්ෂණීය අංගය ලෙස අමා මහ බුදුරදුන්ගේ ඉපදීම බුදුවීම පිරිණිවන්පෑම යන තෙමඟුල වෙසක් කලාපය ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද ස්වාභාවික ද්‍රව්‍ය උපයෝගීකර ගනිමින් ඉතාම අලංකාර අන්දමින් ඒකකය ස්ථානගත නන්දිකාඩාල් කලපුව අසබඩ දර්ශනීය ලෙස ප්‍රදර්ශනය කරන ලදී. එළඹෙන සම්බුදු තෙමඟුල මීට වඩා සාර්ථකව සැමරීමට 12 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරිතුමා ඇතුලු සියලුම නිලයින්ට අවැසි ශක්තිය හා ධෛර්ය ලැබේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.





# 14[සේවා] ශ්‍රීලපාහ නව වෛද්‍ය පරීක්ෂණාගාරය අභිනවයෙන් විවෘත්ත වෙයි



14 (සේවා) ශ්‍රීලපාහ ඒකකයට මහත් අඩුපාඩුවක්ව පැවති වෛද්‍ය පරීක්ෂණාගාරයක් තැනීමේ කටයුතු ආරම්භ කරන ලද්දේ අණදෙන නිලධාරී මේජර් සී ජයවීර ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ය. ඒකකයේ සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉතා ටික කාලයකදී වැඩ නිමකරන ලද මෙම වෛද්‍ය පරීක්ෂණාගාරය අණදෙන නිලධාරී තුමන් සුරතින් 2018.04.07 වන දින සුබ මොහොතින් විවෘත කරන ලදී.

# වාසනාවන් සුබ මංගලම්

## මංගල සීනු



2018 මාර්තු මස 14 වන දින 24 ශ්‍රීලපාහ ඒකකයේ නි/68917 කපිතන් BGAIB ගුණසේකර ශ්‍රීලපාහ අමන්දා තිලිණි මෙනවිය සමගින් යුගදිවියට එළඹෙන ලදී.



2018 අප්‍රේල් මස 30 වන දින 24 ශ්‍රීලපාහ ඒකකයේ නි/68048 කපිතන් RGS උක්වත්ත ශ්‍රීලපාහ මදුෂානි මෙනවිය සමගින් යුගදිවියට එළඹෙන ලදී.



2018 පෙබරවාරි මස 22 වන දින 25 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/331037 සාසෙ රාජපක්ෂ WMSS දුලංජනී දර්ශිකා මෙනවිය සමගින් යුගදිවියට එළඹෙන ලදී.

# ඉගෙනුමට දිරියක් දුන් 15 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී



ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් 99 ගල්මැටියාව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයට යාබදව ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් අතුරින් ඉගෙනුමට දක්ෂතාවයක් දක්වන පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යයාවන් හා එම විහාරස්ථානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ස්වාමීන් වහන්සේ නමකගේ අධ්‍යාපන කටයුතු තවදුරටත් වර්ධනය කරලීමේ අරමුණින් යුතුව 15 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එච්කේජේයු ජයරත්න ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 06ක් පරිත්‍යාග කරන ලදී. තවද පරිගණකය තම ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා භාවිතාකල යුතු ආකාරය හා එමගින් තම අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට උනන්දු විය යුතු ආකාරය පිළිබද මාහැඟි උපදෙස් ලබා දීමටද අණදෙන නිලධාරී තුමන් කටයුතු කරන ලදී.

තවද ඒකක මූලස්ථාන කඳවුරට යාබදව ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල්වල දරුදැරියන් වෙත පරිගණක දැනුම ලබාදීමේ අරමුණින් තිස්සපුර අග්බෝ පුරාණ රජමහා විහාරස්ථානයේ ඉදි කරන ලද පරිගණක අධ්‍යාපන අංශය සඳහා පරිගණක යන්ත්‍ර 05ක් අණදෙන නිලධාරී තුමා විසින් පරිත්‍යාග කරන ලදී.

# තෙවන වරටත් විශිෂ්ඨ ජයග්‍රහණයක්



ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය 2018 වෙනුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පවත්වන ලද පා ගමන අවසානයේදී ශරීර සුවතා ව්‍යායාම සිදුකිරීමෙන් පසු ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදී. එහිදී 15 ශ්‍රීලපාහ ඒකක ක්‍රිකට් කණ්ඩායම සියලු කණ්ඩායම් අභිබවා ජයග්‍රාහී කුසලානය දිනා ගන්නා ලදී. මෙම ජයග්‍රහණයත් සමඟ වසර 03ක් නොකඩවා ශූරතාවය දිනාගෙන ඇති මෙම ඒකකයට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුල තම කීර්තිය පතුරුවාලීමට සමත්ව ඇත.

# 2017 පාබල මේලා සැණකෙළියෙන් 16 ශ්‍රීලපාහට නව ත්‍රීරෝද රථයක්




2017 වර්ෂයේ පාබල මේලා වෙළඳ ප්‍රදර්ශණය හා සැණකෙලිය වෙනුවෙන් ඒකක දායකත්වය දැක්වීමේදී මෙම ඒකකයේ සියලුම සාමාජිකයින් ඉමහත් කැපවීමෙන් හා උනන්දුවෙන් ක්‍රියාකර මෙම සැණකෙලිය සඳහා රුපියල් 3678000.00 ක මුදලක් ලබාදෙන ලදී. ඒ අනුව එම මුදල පාබල මේලා සැණකෙළිය සඳහා වැඩිම මුදල් ලබාදුන් ශ්‍රීලපාහ ඒකක අතුරින් තෙවන ඒකකය ලෙසට පත් වු අතර, ඒ වෙනුවෙන් රෙම ශ්‍රීලපාහ වෙතින් එහි ලාභාංශ වශයෙන් රුපියල් 767700.00 ක මුදලක් ඒකකයෙහි සුභසාධන කටයුතු සඳහා ලබාදෙන ලදී. එම මුදලින් අණදෙන නිලධාරිගේ සංකල්පයක් මත ඒකක සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා ත්‍රීරෝද රථයක් මිලදී ගන්නා ලදී.

2018. 05. 04 වන දින සුභ මොහොතින් ඒකකයේ රාජකාරි සඳහා ධාවනයට යෙදුනු මෙම ත්‍රීරෝද රථය ඒකකයේ එදිනෙදා රාජකාරි කටයුතු වලට ඉමහත් ප්‍රයෝජනවත් විය. කිළිනොච්චි නගරයේ සිට නැවත කඳවුරට පැමිණීම, අසනීප රපොර්තු කරීම, කාර්යාලීය අවශ්‍යතාවයන් සඳහා කිළිනොච්චි නගරය වෙත යෑම වැනි අවශ්‍යතාවයන් කඩිනමින් ඉටු කර ගැනීමට මෙමගින් හැකියාව ලැබිණි. මෙවැනි කාලෝචිත සංකල්පයක් ඉදිපත් කර ක්‍රියාවට නැංවූ 16(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි තුමන් හට ඒකකයේ සියලුම නිලයින්ගේ කෘතඥතාවය මෙසේ පිළිගන්වමු.

# 16 (සෙව්) වන බළඇණියට තවත් ජයග්‍රහණයක්

2018.05.28 වන දින පවත්වන ලද නව නිපැයුම් ප්‍රදර්ශණයේදී 16 (සෙව්) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් ඉදිරිපත් කරන ලද බෝග වගාවන් සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන විද්‍යුත් පෙට්ටිය (Green Box) දෙවන ස්ථානය හිමිකරන්නා ලදී. මෙම නව නිපැයුම් ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කර තිබූ නව නිර්මාණ 37 ක් අතුරින් 16 ශ්‍රීලපාහ නිර්මාණය දෙවන ස්ථානය හිමිකරගත් අතර, එයට හිමි තහතික පත හා මුදලින් ත්‍යාග පිරිනමන ලද්දේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් පැමිණි ආසේමු(කිළි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඩබ්එම්ඒඩබ්එන් රණවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සුරතිණි. මෙම සුවිශේෂී ජයග්‍රහණය ඒකකය වෙත ගෙන දීමට සමත්වූ මෙම විශිෂ්ඨ නිර්මාණය අණදෙන නිලධාරි මේජර් යුආර්එල් පෙරේරා ශ්‍රීලපාහ ගේ මඟපෙන්වීම මත දෙවන අණදෙන නිලධාරි මේජර් කේවීපී විදිරිසිංහ ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ සෙ/16ඩී00294 කෝප්‍රල් නුවන් කුමාර ඩබ්සී යන කොනොනි විසින් නිර්මාණය කරන ලදී.





# 19 ශ්‍රීලපාහ පුවත්



සිංහල අලුත් අවුරුද්ද නිමිත්තෙන් 2018.04.21 වන දින 65 වන සේනාංක මුලස්ථානය යටතේ 651 බසේමු බළප්‍රෙද්ශයේ රාජකාරි කරනු ලබන යුධ හමුදා සාමාජිකයින් හා සිවිල් වැසියන් අතර, සුහදතාවය වර්ධනය කිරීම සඳහා මෙම ඒකකය හා 15 (සෙව්) ශ්‍රීලංසිරෙ, 11 (සෙව්) ගරෙ යන ඒකකයන් විසින් මුලංකාවිල් මහජන ක්‍රීඩාංගනයේ අලංකාරවත් බක්මහ උළෙලක් සංවිධානය කරන ලදී.

2018.04.29 වන දින වෙසක් පොහෝ දින ඒකක අණදෙන නිලධාරි තුමන් ඇතුලු සියළුම නිලයින්ගේ දායකත්වයෙන් 19 ශ්‍රීලපාහ ඒකකය ඉදිරිපිටදී ඒ 32 මාර්ගයේ ගමන් ගන්නා ලද මගී ජනතාව වෙත සිසිල් බීම දන්සලක් සංවිධානය කරන ලදී.

තවද, ආසේමු (කිළි) බළප්‍රදේශය යටතේ රාජකාරියේ නියතු යුධ හමුදා සාමාජිකයින්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් 2018 මාර්තු මස 22,23 සහ 24 යන දිනයන් හදී පවත්වන ලද ජවන හා පිටිය මලල ක්‍රීඩා තරඟාවලියෙන් ආසේමු(කිළි) බළප්‍රදේශයේ සියලු ඒකක පරදවා 19 ශ්‍රීලපාහ ඒකකය ජයග්‍රහණය කරන ලදී.

## නිරෝගිමත් හමුදාවක්, නිරෝගිමත් දැයක් තරඟයෙන් යුද්ධ හමුදාවේ 5 ස්ථානය 19 ශ්‍රීලපාහට



යුද්ධ හමුදාධිපති තුමාගේ සංකල්පයකට අනුව "නිරෝගිමත් හමුදාවක් නිරෝගිමත් දැයක්" යන තේමාව යටතේ නිලධාරීන් හා සෙසුනිලයින් බෝ නොවන රෝග මගින් ආරක්ෂා කරගැනීමේ වැඩසටහනේදී උනන්දුවෙන් හා කැපවීමෙන් රාජකාරි කරනු ලබන බළඇණි අතර තරඟාවලියක් පවත්වන ලදී. එහිදී ආසේමු (කිළි) බළ ප්‍රදේශයේ ඇති ඒකක සමඟ පවත්වන ලද තරඟයේදී 19 ශ්‍රීලපාහ ඒකකයට පළමු ස්ථානය හිමිවිය. පසුව ආසේමු නිරීක්ෂණයෙන් ලබාදුන් ළකුණු ප්‍රමාණය අනුව මෙම තරඟාවලියේදී සමස්ථ යුද හමුදාවේ සියළු බළඇණි අතුරින් 19 ශ්‍රීලපාහ ඒකකයට 5 වන ස්ථානය හිමිවිය. මෙම ජයග්‍රහණය සඳහා හිටපු අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඑම්එස්ජේ තෙන්නකෝන් ආර්එස්පී ශ්‍රීලපාහ තුමන් විසින් පූර්ණ මගපෙන්වීම සිදුකල අතර, 2018.03.14 වන දින ත්‍යාග සහ සහතිකපත් ලබාදීමේ උත්සවය යුද්ධ හමුදාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් යුහ රෝහල් ශ්‍රවණාගාරයේදී පැවති අතර, මෙම ඒකකයේ ජයග්‍රහණයට හිමි ත්‍යාග හා සහතික පත හිටපු අණදෙන නිලධාරි තුමන් වෙත එහිදී ප්‍රදානය කරන ලදී.

බළඇණි පුවත් 20 ශ්‍රීලපාහ

# 66 සේමු නව සේනාංකාධිපති තුමාගේ 20 ශ්‍රීලපාහ කඳවුරු සංචාරය



66 සේමු නව සේනාංකාධිපති වශයෙන් වැඩ භාරගත් බ්‍රිගේඩියර් ජී ඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමාගේ 20 ශ්‍රීලපාහ සංචාරය 2018.04.24 වන දින සිදුවූ අතර, එම සංචාරය සඳහා 662 බසේමු බළසේනාධිපති තුමන් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද සහභාගී වන ලදී.

මෙහිදී ඒකක අණදෙන නිලධාරි වන මේජර් එල්කේපේ හර්ෂප්‍රිය ආර්එස්පී ශ්‍රීලපාහ විසින් එතුමන් පිළිගැනීමෙන් පසු ඒකකයේ භට පිරිස් විසින් කඳවුරු මුරයක් පිරිනමන ලද අතර, එතුමාගේ කඳවුරු සංචාරය සිහිවීම වස් අඹ පැළයක් රෝපණය කරන ලදී. 20 ශ්‍රීලපාහ කඳවුරු සැකැස්ම හා ක්‍රමවත්බව පිළිබඳව ප්‍රසංශා කරන ලද එතුමන් තම සංචාරය නිම කරන ලදී.

බළඇණි පුවත් 21 ශ්‍රීලපාහ

# 65 සේනාංකාධිපති තුමන්ගේ 21 (සෙව්) ශ්‍රීලපාහ කඳවුරු සංචාරය



65 වන සේනාංකයේ නව සේනාංකාධිපති ලෙසින් අභිනවයෙන් රාජකාරියේ වැඩ භාරගත් මේජර් ජෙනරාල් එච්ආර්කේපී පීරිස් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2018.04.04 වන දින 21 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ කඳවුරු සංචාරයක නිරත විය. ඒකකය වෙත පැමිණි සේනාංකාධිපති තුමන් හට ඒකක අණදෙන නිලධාරි මේජර් එන්බීඒයූකේ නිශ්ශංක ආර්එස්පී ශ්‍රීලපාහ විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමා ඒකකය වෙත මහත් හරසරින් පිළිගන්නා ලදී.

බළඇණි පුවත් 23 ශ්‍රීලපාහ

# ජාතික පරිසර දිනය සහ ජගත් පරිසර දිනයේදී 23 ශ්‍රීලපාහ ලොවටම ලබාදුන් ආදර්ශය



"පරිසරය අපේ ජීවයයි" යන තේමාව මුල් කරගෙන ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඑල්එම් චන්ද්‍රසේකර ආර්ඩබ්ලිව්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් ඒකක සාමාජිකයින් 100 දෙනෙකුගෙන් සමන්විත පිරිසකගේ සහභාගීත්වයෙන් ජාතික පරිසර දිනය සහ ජගත් පරිසර දිනය වෙනුවෙන් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් අපවිත්‍රව තිබූ සුන්දර මුලතිව් වෙරළ තීරයෙහි කි:මී: 08 ක් පමණ දුරක් පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2018.06.05 දින ක්‍රියාත්මක කර ලොවට මහඟු ආදර්ශයක් ලබාදීමට සමත් විය.

# 23 ශ්‍රීලපාහ බක්මහ අසිරිය







23 ශ්‍රීලපාහ ඒකකයේ කොනොනි සමාජ ශාලාවේ සියලුම සාමාජිකයින් විසින් සංවිධානය කරනු ලැබූ 2018 බක්මහ අසිරිය රැගත් අලුත් අවුරුදු උත්සවය 2018.04.28 වන දින බළඇණි මූලස්ථාන භූමියේදී උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. චාරිත්‍ර වාරිත්‍ර වලට මුල් තැනක් දෙමින් සාම්ප්‍රදායික ජන ක්‍රීඩා සහ අලුත් අවුරුදු ක්‍රීඩා රාශියකින් සමන්විතව පවත්වන ලැබූ මෙම අලුත් අවුරුදු උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් 23 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඑල්එම් චන්ද්‍රසේකර ආර්ඩබ්ලිව්පී පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සහභාගී විය.

මෙම අලුත් අවුරුදු උළෙලේ එක් අංගයක් වශයෙන් සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලද අතර, දවස පුරා පැවති බක්මහ උළෙලේදී ජයග්‍රාහකයින් හට වටිනා ත්‍යාග ලබාදුන් අතර, මෙම බක්මහ උළෙල ඒකකයේ සියලු දෙනගේ හදවත්වල සුන්දර මතකයක් සනිටුහන් කරමින් නිමාවට පත් විය.

# 24 ශ්‍රීලපාහ වන්දනා හා විනෝද චාරිකාව II අධියර



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති තුමන්ගේ අනුමැතිය මත බළප්‍රදේශයේ රාජකාරි නිරත සෙසුනිල යුද හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ ඥාතීන් වෙනුවෙන් 2018 අප්‍රේල් මස 19, 20, 21 යන දිනයන්හිදී වන්දනා චාරිකාවක් සංවිධානය කරන ලදී. මෙම චාරිකාව සඳහා බළප්‍රදේශයේ රාජකාරි කරනු ලබන යුධ හමුදා සහ සිවිල් සේවක මහතුන් 64 දෙනෙකුගෙන් යුත් පිරිසක් සහභාගී වූ අතර, 24 ශ්‍රීලපාහ ඒකකය වෙතින් ද සෙනින් 07 දෙනෙකුගේ හා එක් සිවිල් සේවක මහතෙකු ද ඔවුන්ගේ පවුලේ සමාජිකයින් සමගින් මෙම චාරිකාවට එක්වීමට අවස්ථාව හිමි විය. සංචාරයේදී අටමස්ථාන වන්දනා කරගැනීමටත් මඩු පල්ලි, මිහින්තලය, තන්තිරිමලය රජමහා විහාරය වැනි නොයෙකුත් ස්ථාන වැඳ පුදා ගැනීමටත් ඔවුනට හැකි විය.

# නව නිපැයුම් ප්‍රදර්ශණය 2018



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ නව නිර්මාණ සහ කුසලතා විදහා දැක්වීම වෙනුවෙන් 2014 වර්ෂයේ සිට මේ දක්වා ආසේමු මට්ටමින් පවත්වන ලද නව නිපැයුම් ප්‍රදර්ශනය මෙවරත් ඉතා සාර්ථක අන්දමින් පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා 24 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් බීඑච්එම්සී බෙලිගස්වත්ත ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මඟපෙන්වීම යටතේ කපිතන් ටීටී උඩුගලගේ ශ්‍රීලපාහ නිලධාරිගේ අධීක්ෂණය යටතේ සෙ/330188 ලාකෝ පෙරේරා පීඑස් යන කොනොනි විසින් බඩ ඉරිඟු ඇට ගලවන යන්ත්‍රයක් නිර්මාණය කර මෙම ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කරන ලදී.

බළඇණි පුවත් 25 ශ්‍රීලපාහ

# 25 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්



මෙම ඒකකය 2018.04.02 දින 61 සේමු පුපා පම්පෙමඩුහිදී බළඇණි පුහුණු පාඨමාලාව ඇල්ෆා, බ්‍රාවෝ සහ චාර්ලි වශයෙන් කණ්ඩායම් තුනකින් සමන්විතව ආරම්භ කල අතර, දින 45 ක් පුරා පැවති මෙම පුහුණු පාඨමාලාව 2018-05-28 දින සාර්ථකව නිම විය. පාඨමාලාවේ දක්‍ෂතම නිලධාරි අණදෙන වශයෙන් "බී" කණ්ඩායමේ කපිතන් ආර්සීඑන්බී රන්කොත්ගෙදර ශ්‍රීලපාහ ද, හොඳම ශාරීරික යෝග්‍යතාවෙන් හෙබි සෙබලා ලෙස සෙ/320685 ලාකෝ විජේබණ්ඩාර ඒච්එම්වල් ද, දක්‍ෂතම සෙබලා ලෙස සෙ/332548 සාසෙ ප්‍රේමදාස යූපීජීආර්එම් හා හොඳම වෙඩික්කරු ලෙස සෙ/333657 සාසෙ සමන්ත බණ්ඩාර ආර්එම් යන අය තෝරා ගන්නා ලදී. සමස්ථ පාඨමාලාවේ හොඳම කණ්ඩායම වශයෙන් දක්‍ෂතා දක්වමින් "සී" කණ්ඩායම සුදුසුකම් ලබාගන්නා ලදී.

# නික්ම යන අණදෙන නිලධාරි තුමණි ඔබගේ ආදර්ශමත් නායකත්වයට මෙයයි අපගේ සුභාශිංසනය



25 ශ්‍රීලපාහ ඒකකයේ 6 වන අණදෙන නිලධාරි ලෙස 2015 දෙසැම්බර් මස 25 වන දින ඒකකයට පැමිණි ලුතිතන් කර්නල් ඩබ්ලිව්කේඑස්ජීඑම්ආර්ඒබී දොඩම්වල පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි වසර 2 ක පමණ කාලයක් තම ධූරයේ රාජකාරි කර 2017 දෙසැම්බර් මස 28 වන දින ඒකකයෙන් නික්මයන ලදී. ඒකකයේ අභිවෘද්ධිය වෙනුවෙන් අනුපමේය මෙහෙයක් ඉටු කළ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් කොනොනි සමාජ ශාලාව මුළුතැන්ගෙය, නිලධාරි නිවස්නය පිළිසකර කිරීම හා කඳවුරු පරිශ්‍රයේ ඇති ගොඩනැගිලි සංවර්ධනය කර විශාල සංවර්ධන කර වන්නි බළප්‍රදේශය තුල සියලුම අංගයන්ගෙන් පරිපූර්ණ කඳවුරක් බවට පත් කරන ලදී. නික්ම ගිය ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමණි ඔබගේ ඉදිරි හමුදා දිවිය අතිශයින්ම සාර්ථක එකක් වේවායි අපගේ හදවතේ පැතුමයි.

# 25 ශ්‍රීලපාහ බළඇණියේ 7 වන නියමුවාණන්

25 ශ්‍රීලපාහ ඒකකයේ 7 වන අණදෙන නිලධාරි ලෙසින් මේජර් එච්එම්එම්පී හේරත් ආර්එස්පී ශ්‍රීලපාහ 2017 දෙසැම්බර් 29 වන දින සුභ මොහොතින් තම රාජකාරි ආරම්භ කරන ලදී. නව අණදෙන නිලධාරි තුමන් කඳවුරු පිවිසුම අභියසදී සම්මාන මුරයකින් පුද ලැබූ අතර, චිරාගත සම්ප්‍රදානුකූලව පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව ත්‍රිවිධරත්නයේ ආශිර්වාද මධ්‍යයේ තම ධූරයේ රාජකාරි කටයුතු ආරම්භ කරන ලදී.



## දැන්වීමයි

පාබල හමුදා සිල්වර් බියුගල්ස් සංගීත කණ්ඩායම වෙත ඉංග්‍රීසි, හින්දි, දෙමළ හා වෙනත් භාෂා වලින් ගීත ගායන හැකියාව ඇති අයවලුන් සඳහා පුරප්පාඩු ඇත. මේ සඳහා වයස අවු: 18 - 24 ත් අතර දක්ෂතාවයන් වලින් හෙබි තරුණයන්ට අයදුම් කල හැක.

**වැඩි විස්තර සඳහා**
**තූර්ය වාදක කණ්ඩායම භාර නිලධාරි**
**0771 043 192**

## ජීවිතයට වදනක්




## සුබ උපන්දිනයක් වේවා


2018.05.26 වන දින 2 වන උපන්දිනය සැමරූ 15 ශ්‍රීලපාහ ඒකකයට අයත් කෝප්‍රල් ජයරත්න SSS ගේ ආදරණීය පුතණුවන් නෙතුෂ තරුෂාන්


2018.06.20 වන දින 2වන උපන් දිනය සමරූ 15 ශ්‍රීලපාහ ඒකකයට අයත් කෝප්‍රල් සමරනායක NWPC ගෙ ආදරණීය දියණිය සදසි විහඟනා


2018.07.11 වන දින 8 වන උපන් දිනය සැමරූ 24 ශ්‍රීලපාහ ලාකෝ සමන් කුමාර NAC ගේ ආදරණීය පුතණුවන් චමිල සඳරුවන්


2018.04.04 වන දින 1 වන උපන්දිනය සැමරූ 15 ශ්‍රීලපාහ ඒකකයට අයත් සාසෙ විජේරත්න IGJN ගේ ආදරණීය දියණිය කවිෂි විහන්සා


2018.06.15 වන දින 7වන උපන් දිනය සමරූ 11 ශ්‍රීලපාහ ඒකකයට අයත් කෝප්‍රල් මහින්දසේන AGMR ගෙ ආදරණීය දියණිය සංයුක්ති යුමේෂා


2018.02.07 වන දින 4වන උපන් දිනය සමරූ 11 ශ්‍රීලපාහ ඒකකයට අයත් කෝප්‍රල් මහින්දසේන AGMR ගෙ ආදරණීය දියණිය ඉනුරි ඉමේෂා

## ලෙංගතුකම



දුවේ...
නුඹගේ...
අව්‍යාජ සිනහව
තෙපුලාවි අදහස්
ගොන්නක්

---

සංකල්පනාව
මේජර් එම්කේ මනෝජ් කුමාර ශ්‍රීලපාහ

ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ ධජ තැන්පත් කිරීමේ කුටිය විවෘත කිරීමේ උත්සවයට සහභාගී වූ ප්‍රධාන ආරාධිත අමුත්තා සමගින් පාබල හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

